# Sinhala - FriMi General Terms and Conditions

## 1.1 Sinhala - FriMi General Terms and Conditions

මෙම නියමයන් සහ කොන්දේසි, (මෙහි මින්මතු අර්ථ නිරූපණය කර ඇති පරිදි) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ එක් එක් ගනුදෙනුකරු අතර නෛතික ගිවිසුමක් සාදනු ලබන අතර, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරුවකු වෙත සලසා දෙනු ලබන FriMi සේවාවන්හි භාවිතය පාලනය කරනු ලබන්නේ ය.

පහත දැක්වෙන “මම පිළිගනිමි” යන බටනය ක්ලික් කිරීම මගින්, ගනුදෙනුකරු මතු දැක්වෙන කරුණු පිළිගෙන ඒවා තහවුරු කරයි :

එනම්, මෙම නියමයන් සහ කොන්දේසි, FriMi සේවාවන්ට අදාළ විස්තර සමඟින්, ගනුදෙනුකරු හට පැහැදිලි කර දී ඇති බවත්, ගනුදෙනුකරු, මෙම නියමයන් සහ කොන්දේසි සහ ඊට අදාළ විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත්, ඒවා අනුව බැඳී සිටීමට එකඟත්වය වෙමින් ඊට කැමැත්ත පළ කර ඇති බවත් යන්න ය.

1. අර්ථ නිරූපණ

මෙම ලියවිල්ලෙහි සහ FriMi සේවාවන්හි භාවිතයට අදාළව, වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස :

අ. **“ගනුදෙනුකරු”** යන්නෙන්, මෙම නියමයන් සහ කොන්දේසි පිළිගෙන FriMi ඇප් එක බාගත කර ස්ථාපනය කිරීම මගින් එකී FriMi ඇප් එකෙහි දැක්වෙන කාර්යයන් භාවිතා කිරීම සඳහා තෝරා ගන්නා පුද්ගලයෙකු හෝ FriMi ඇප් එක පමණක් බාගත කර ස්ථාපනය කරන පුද්ගලයෙකු අදහස් වන්නේ ය.

ආ. **"ආයතනික වෙබ් අඩවිය"** යන්නෙන්, [https://www.nationstrust.com/](https://www.nationstrust.com/) යන වෙබ් යොමුවෙහි ඇති නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ **වෙබ් අඩවිය** අදහස් වන්නේ ය.

ඇ. “FriMi **ගිණුම**” යන්නෙන්, FriMi සේවාවන් වෙත ප්‍රවේශ වීමේ සහ FriMi සේවාවන් භාවිතා කිරීමේ කාර්යය සඳහා ගනුදෙනුකරු විසින් FriMi ඇප් එකෙහි නිර්මාණය කර ගනු ලබන පරිශීලක ගිණුම (ඒ හැර, වෙනත් කිසිදු බැංකු ගිණුමක් හෝ වෙනත් යම් ගෙවීම් මෙවලමක් නොවේ) අදහස් වන්නේ ය.

ඈ. “FriMi ඇප් එක” යන්නෙන්, අනුමත යෙදුම් සැලකින් (ඇප් ස්ටෝර් හරහා) බාගත කර ගත හැකි ජංගම උපාංග මත ධාවනය කිරීම සඳහා නිර්මාණය කර ඇති FriMi මෘදුකාංග යෙදුමක් (ඇප් එකක්) අදහස් වන්නේ ය.

ඉ. “FriMi **සහය**” (Assistance) යන්නෙන්, FriMi ඇප් එකෙහි කාර්යයන් සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිහිටුවන ලද, අදාළ විස්තර FriMi වෙබ් අඩවියෙහි දක්වා ඇති සේවා මධ්‍යස්ථානය අදහස් වන්නේ ය.

ඊ. “FriMi **ඉතිරිකිරීමේ ගිණුම**” යන්නෙන්, FriMi ඇප් එක හරහා ගනුදෙනුකරුවකු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි විවෘත කරනු ලබන, FriMi මූල්‍ය සේවා සැපයීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන්නා වූ ඉතුරුම් ගිණුම අදහස් වන්නේ ය.

උ. “FriMi **සම්බන්ධතාකරු**” (Contact) යන්නෙන්, ගනුදෙනුකරුගේ FriMi ගිණුමේ සම්බන්ධතා ලැයිස්තුවේ අදාළ සබඳතා තොරතුරු සුරැකි කර ඇති තෙවන පාර්ශ්වයක් (පුද්ගලයෙකු හෝ ආයතනයක්) අදහස් වන්නේ ය.

ඌ. “FriMi **ඩෙබිට් කාඩ්පත**” යන්නෙන්, FriMi භෞතික **ඩෙබිට්** කාඩ්පත සහ/හෝ FriMi අතත්‍ය **ඩෙබිට්** කාඩ්පත අදහස් වන්නේ ය.

එ. “FriMi **භෞතික ඩෙබිට් කාඩ්පත**” (FriMi Physical Debit Card) යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරන ලද, FriMi ඉතිරිකිරීමේ ගිණුමට සම්බන්ධනය කර ඇති **ඩෙබිට්** කාඩ්පතක භෞතික අනුවාදය අදහස් වන්නේ ය.

ඒ. “FriMi **අතත්‍ය ඩෙබිට් කාඩ්පත**” (FriMi Virtual Debit Card) යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරන ලද, FriMi ඉතිරිකිරීමේ ගිණුමට සම්බන්ධනය කර ඇති **ඩෙබිට්** කාඩ්පතක ඩිජිටල් අනුවාදය අදහස් වන්නේ ය.

ඔ. **"නේෂන්ස් ට්‍රස්ට් බැංකුව බලගැන්වූ FriMi"** යන්නෙන්, ගනුදෙනුකරුවන් වෙත FriMi සේවාවන් සැපයීමට අදාළව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හා එහි ආශ්‍රිත හවුල්කරුවන් සතු සහ ඔවුන් විසින් පරිපාලනය කරනු ලබන තාක්ෂණික නිර්මාණය අදහස් වන්නේ ය.

ඕ. **"FriMi සේවා"** යන්නෙන්, FriMi ඇප් එක හරහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන FriMi මූල්‍ය සේවා සහ FriMi මූල්‍ය නොවන සේවා අදහස් වන්නේ ය.

ක. **"FriMi මූල්‍ය සේවා"** යන්නෙන්, FriMi ඇප් එකෙහි ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන, අරමුදල් ලැබීම් සහ ගෙවීම් ආශ්‍රිත ගනුදෙනු වලින් සමන්විත මූල්‍ය සේවා අදහස් වන්නේ ය.

ග. **"FriMi මූල්‍ය නොවන සේවා"** යන්නෙන්, FriMi ඇප් එකෙහි ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන, පහත සඳහන් දෑ ඇතුළත් වන නමුත් ඉතා නිශ්චිතවම FriMi මූල්‍ය සේවාවලින් බැහැරව සැලකෙන මූල්‍ය නොවන සේවා අදහස් වන්නේ ය.

- අලෙවිකරණ තොරතුරු පරිශීලනය කිරීම
- ප්‍රවර්ධන තොරතුරු සහ හඳුන්වා දීමේ ප්‍රදර්ශන පරිශීලනය කිරීම
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ATM ස්වයංක්‍රීය බැංකු ගනුදෙනු යන්ත්‍ර සහ එහි ශාඛා පිළිබඳ සෙවුම් කවුළුව පරිශීලනය කිරීම
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ලබන වෙනත් එබඳු ගනුදෙනු

ච. **"FriMi වෙබ් අඩවිය"** යන්නෙන්, www.FriMi .lk වෙබ් යොමුව අදහස් වන්නේ ය.

ජ. **"අරමුදල් ලැබීම්"** යන්නෙන්, අරමුදල් මාරු කිරීම මගින් හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ලබන පරිදි, ටෝකන් පත් මුදාගැනීම මගින් හෝ වෙනත් යම් ආකාරයකින් කිසියම් ගෙවීම් මෙවලමක් වෙත මුදල් ලැබීම අදහස් වන්නේ ය.

ට. **"ලයිෆ් ස්ටයිල් සේවා"** (Lifestyle Services) යන්නෙන්, FriMi ඇප් එකෙහි සෘජු හර විකල්පය හරහා මිලදී ගැනීම හෝ දායක මුදල් ගෙවීම සඳහා කරනු ලබන සේවා සපයන්නන්ගේ නිෂ්පාදන හෝ සේවාවන් ය.

ඩ. **"අලෙවිකරුවන්"** යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ ලියාපදිංචි වීම මගින් FriMi ඇප් එකෙහි අඩංගු කාර්යන් තම ව්‍යාපාර අරමුණු සඳහා භාවිතා කිරීමට තෝරා ගන්නා භාණ්ඩ සහ/හෝ සේවා සපයන්නන් අදහස් වන්නේ ය.

ණ. **"අවම ශේෂය"** යන්නෙන්, කලින් කලට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් දැනුම් දෙනු ලබන සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි තනි අභිමතය පරිදි වෙනස් කිරීමට යටත් වන, ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමෙහි පවත්වා ගත යුතු අවම ශේෂය (තිබේ නම්) අදහස් වන්නේ ය.

ත. **"ජංගම උපාංගය"** යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ලබන යම් පිරිවිතර අවශ්‍යතාවලට යටත්, ජංගම විදුලි සංදේශන ජාල වෙත සම්බන්ධ වීමට හැකියාව සහිත සහ අන්තර්ජාල සම්බන්ධනය ඇති ජංගම දුරකථන, ටැබ්ලට්, ෆැබ්ලට් හෝ වෙනත් යම් ජංගම උපකරණයක්, අදහස් වන්නේ ය.

ද. **"ජංගම අංකය"** යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ සන්නිවේදනය පවත්වා ගැනීම පිණිස සම්බන්ධතා අංකයක් ලෙස FriMi ඇප් එක සඳහා ලියාපදිංචි වන විට ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ ලියාපදිංචි වී ඇති හෝ වෙනත් ආකාරයකින් ලබා දී ඇති එම ගනුදෙනුකරුගේ ජංගම අංකය අදහස් වන්නේ ය.

න. **"නේෂන්ස් ට්‍රස්ට් බැංකුව"** යන්නෙන්, PQ 118 දරන ලියාපදිංචි කිරීමේ අංකය යටතේ, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සහ 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමැති පොදු සීමිත වගකීම් සමාගමක් අදහස් වන අතර, ඊට එහි අනුප්‍රාප්තිකයින් සහ අවසර ලත් පැවරුම්කරුවන් ඇතුළත් වන්නේ ය.

ප. **"ගෙවුම් මුදල"** යන්නෙන්, අදාළ ගාස්තු, අනෙකුත් ගාස්තු සහ බදු සමඟ ගෙවිය යුතු වන්නා වූ ගෙවීම් සම්බන්ධ ගනුදෙනුවකට අයත් ශ්‍රී ලංකා රුපියල් වටිනාකමේ මුදල (හෝ, අදාළ වන අවස්ථාවක දී, විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණ වටිනාකම) අදහස් වන්නේ ය.

බ. **"ගෙවීම් මෙවලම්"** යන්නෙන්, ගෙවීම් ගනුදෙනු සිදු කිරීම සඳහා FriMi ගිණුමේ ලියාපදිංචි වීම පිණිස ගනුදෙනුකරු විසින් තෝරා ගනු ලැබ ඇති, FriMi ඉතුරුම් ගිණුම, FriMi **ඩෙබිට් කාඩ්පත** සහ එබඳු වෙනත් බැංකු ගිණුම් (නේෂන්ස් ට්‍රස්ට්

බැංකුවේ සහ/හෝ වෙනත් බැංකුවල) සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිළිගනු ලබන වෙනත් ක්‍රෙඩිට් කාඩ්පත් සහ/හෝ **ඩෙබිට්** කාඩ්පත් අදහස් වන්නේ ය.

ම. **"ගෙවීම් ගනුදෙනුව"** යන්නෙන්, FriMi ඇප් එකෙහි වැඩිදුර විස්තර (අදාළ අවස්ථාවල දී සීමාවන් ද ඇතුළුව) දක්වා ඇති, පහත සඳහන් ගනුදෙනු හා සම්බන්ධයෙන් ගනුදෙනුකරුට අදාළ ගෙවීම් මෙවලම විෂයයෙහි සිදු කෙරෙන්නා වූ, ගෙවුම් මුදල හා සම්බන්ධ හර කිරීම්වල, අය කිරීම්වල හෝ වෙනත් අදාළ ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සිදු කෙරෙන යම් ගෙවීමක් සැකසීම අදහස් වන්නේ ය :

- ගනුදෙනුකරුවන් අතර මුදල් මාරු කිරීම
- යම් ගනුදෙනුකරුවෙකුගේ සිට ගනුදෙනුකරුගේ FriMi සම්බන්ධතාකරු වෙත මුදල් මාරු කිරීම
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි ලියාපදිංචි වී සිටින උපයෝගිතා සේවා සපයන්නන් වෙත ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන ගෙවීම්
- FriMi ගෙවීම් සේවා පිළිගන්නා වෙළඳුන් වෙත ගනුදෙනුකරු විසින් කරනු ලබන ගෙවීම්
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි ලියාපදිංචි වී සිටින සේවා සපයන්නන් වෙත ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන ගෙවීම්
- අන්තජර්ාල මාගර්ගත ගෙවීම්
- ටෝකන් පත් නිමර්ාපණය කර ගැනීම
- අරමුදල් ආපසු ගැනීම
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දෙන පරිදි ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම් නිපැයුම් විවෘත කිරීම
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් විසින් කලින් කලට දැනුම් දෙනු ලබන වෙනත් එබඳු ගනුදෙනු

ය. **"අවසර ලත් විදේශ ගනුදෙනු"** යන්නෙන්, අදාළ එක් එක් කාරණය සම්බන්ධයෙන් ආයතනික වෙබ් අඩවිය, FriMi වෙබ් අඩවිය සහ/හෝ FriMi ඇප් එකට අයත් වෙනත් සමාජ මාධ්‍ය වේදිකාවල දක්වා ඇති සීමාවන්ට යටත්, FriMi ඉතුරුම් ගිණුම වෙත විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබෙන ප්‍රේෂණ සහ ගෙවීම් මෙවලමක් හරහා ජාත්‍යන්තර ගනුදෙනු සඳහා විදේශ ව්‍යවහාර මුදල්වලින් කෙරෙන මාගර්ගත ගෙවීම් අදහස් වන්නේ ය.

අ. **"සේවා සපයන්නා"** යන්නෙන්, FriMi ඇප් එක හරහා ලයිෆ් ස්ටයිල් සේවා සැපයීම සඳහා ලියාපදිංචි වීම මගින් ස්වකීය ව්‍යාපාර අරමුණු වෙනුවෙන් FriMi ඇප් එකෙහි අන්තගර්ත කාර්යයන් භාවිතා කිරීම පිණිස ඉදිරිපත් වන භාණ්ඩ හෝ සේවා සපයන්නන් අදහස් වන්නේ ය.

ආ. **"ලියාපදිංචි කිරීමේ තොරතුරු"** යන්නෙන්, 4 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි FriMi ගිණුමක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අදාළ වන අවශ්‍යතා සපුරාලීම සඳහා ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත සපයනු ලබන තොරතුරු සහ තහවුරු කිරීමේ සාක්ෂි අදහස් වන්නේ ය.

ඇ. **"නියමයන් සහ කොන්දේසි"** යන්නෙන්, කලින් කලට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පරිපූරණය කරනු ලබන, ආදේශ කරනු ලබන, සංශෝධනය කරනු ලබන හෝ ප්‍රතිස්ථාපනය කරනු ලබන නියමයන් සහ කොන්දේසි අදහස් වන්නේ ය.

ඈ. **"ටෝකන් පත"** යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයත් ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු කිරීමේ ඒටීඑම් යන්ත්‍රයකින් මුදල් ආපසු ලබා ගැනීම සඳහා හෝ FriMi ඇප් එක හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි ජංගම බැංකු කටයුතු ඇප් එක හරහා මුදල් මුදා ගැනීම සඳහා භාවිතා කළ හැකි, තැගි වවුචරයකට සමාන විද්‍යුත් ටෝකන් පතක් අදහස් වන්නේ ය.

ඉ. **"ගනුදෙනු සීමාව"** යන්නෙන්, එක් එක් ගෙවීම් ගනුදෙනුව සඳහා වැය කළ හැකි, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අදාළ මුදල කලින් කල දැනුම් දෙනු ලබන හා එහි තනි අභිමතය පරිදි වෙනස් වීමට යටත්, උපරිම මුදල් වටිනාකම අදහස් වන්නේ ය.

ඊ. **"පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර"** යන්නෙන්, ගනුදෙනුකරුගේ FriMi ගිණුමට ප්‍රවේශ වීම සහ/හෝ FriMi මූල්‍ය සේවා භාවිතා කිරීම සඳහා ගනුදෙනුකරුවකු විසින් ලියාපදිංචි කරනු ලැබ ඇති පරිශීලක හැඳුනුම්පත්, පුද්ගල හැඳුනුම්පත් අංක, මුරපද සහ ජෛවමිතික දත්ත අදහස් වන්නේ ය.

2. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව බලගැන්වූ ෆ්‍රිමි

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරු වෙත FriMi ඇප් එක ආශ්‍රිත සේවාවන් සලසා දෙනු ලැබීමත්, ගනුදෙනුකරු විසින් ඒවා භාවිතා කරනු ලැබීමත් FriMi වෙබ් අඩවියෙහි සහ FriMi ඇප් එකෙහි දක්වා ඇති, මෙහි සඳහන් කර අන්තගර්ත කර තිබෙන්නා වූ උපදෙස්, පිරිවිතර හා සීමා කිරීම් සහිත නියමයන් සහ කොන්දේසි මගින් පාලනය කරයි. තමා වෙත FriMi සේවා සපයා ගනු ලැබීම හා සම්බන්ධ වැඩිදුර විස්තර ලබා ගැනීම පිණිස FriMi වෙබ් අඩවිය වෙත පිවිසීමටත්, එසේ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට තමා හට අවශ්‍ය වන අවස්ථාවක දී FriMi සහය මධ්‍යස්ථානය සම්බන්ධ කර ගැනීමටත් ගනුදෙනුකරු එකඟ වේ. විශේෂයෙන්ම, මෙකී නියමයන් සහ කොන්දේසි විෂයයෙහි සිදු කෙරෙන යම් සංශෝධන හෝ පරිපූරක පිළිබඳ තොරතුරු එම වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කළ යුතු අතර විද්‍යුත් පණිවිඩයක් මගින් ඒ බව ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

3. FriMi මූල්‍ය සේවා භාවිතා කිරීම

FriMi මූල්‍ය සේවා භාවිතා කරනු පිණිස ගනුදෙනුකරු විසින් තම FriMi ගිණුම හරහා ගෙවීම් මෙවලමක් ලියාපදිංචි කරනු ලබන පිටුවල ඊට අවශ්‍ය සියලු තොරතුරු විෂයාංග සපයා සම්පූර්ණ කළ යුතු ය.

අදාළ ගෙවීම් මෙවලම්, ඒවා නිකුත් කරනු ලබන මූල්‍ය ආයතනය හමුවේ සුමට තත්ත්වයේ පවත්නා බව තහවුරු කර ගැනීම පිණිස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගනුදෙනුකරු විසින් බලය පවරා දෙනු ලබන්නේ ය.

4. FriMi සේවා සඳහා ලියාපදිංචිවීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන අවශ්‍යතා

අ) FriMi සේවාවන් සඳහා ලියාපදිංචි වීමේ කාර්යය සඳහා ගනුදෙනුකරුවකු පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු ය :

i. වයස අවුරුදු 18 ට වඩා වැඩි වීම ;

ii. ශ්‍රී ලංකාවේ පදිංචිකරුවෙකු වීම හෝ අනේවාසිකයෙකු වන්නේ නම්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිළිගනු ලබන වලංගු රැකියා වීසා බලපත්‍රයක් තිබීම ;

iii. FriMi ඇප් එක බාගත කිරීම සහ FriMi සේවා භාවිතා කිරීම සඳහා සුදුසු මෘදුකාංග සහිත ජංගම උපාංගයක් සන්තකයේ තිබීම ;

iv. ගනුදෙනුකරුගේ නමින් ලියාපදිංචි ජංගම දුරකථන අංකයක් ලබා දීම (එසේ නැතහොත්, ගනුදෙනුකරුගේ නොවන වෙනත් පුද්ගලයෙකුගේ නමින් ඇති යම් ජංගම දුරකථන අංකයක් භාවිතා කිරීම සඳහා අවසර ලබා දීම) ; සහ

v. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ මුදල් විශුද්ධිකරණයට එරෙහි අවශ්‍යතා සහ "ඔබේ ගනුදෙනුකරු දැනගන්න" යන කරුණට අදාළ තොරතුරු පිළිබඳ අවශ්‍යතා සපුරාලීම.

ආ) ඉහත සඳහන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් ලියාපදිංචි කිරීමේ තොරතුරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත සපයනු ලැබිය යුතු ය. කලින් කලට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නියම කරනු ලබන ආකාරයට එකී ලියාපදිංචි කිරීමේ තොරතුරු සැපයිය යුතු අතර, FriMi ඇප් එක හරහා ඩිජිටල්ගතව කෙරෙන ලියාපදිංචි කිරීමේ තොරතුරු ඉදිරිපත් කිරීම් ඊට ඇතුළත් විය යුතු ය. අවශ්‍යතාවයක් මතු වන්නේ නම්, තෙවන පාශර්වයන් වෙතින් අදාළ ලියාපදිංචි කිරීමේ තොරතුරු සත්‍යාපනය කර ගැනීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

ඇ) ඉහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් සෑහීමට පත් වන්නේ ද යන්න නොසලකා, කිසියම් පුද්ගලයෙකු ගනුදෙනුකරුවකු ලෙස ලියාපදිංචි කිරීම අනුමත කිරීමේ තනි අභිමතය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ. අදාළ ලියාපදිංචි කිරීම සාථර්කව අවසන් වූ පසු, FriMi සේවාවන් භාවිතා කිරීම ආරම්භ කිරීම සඳහා යම් ගනුදෙනුකරුවකුට හැකි වන පරිදි, FriMi ඇප් එක හරහා එකී ගනුදෙනුකරුගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල මගින් සහ/හෝ ජංගම දුරකථන අංකයට යොමු කෙරෙන කෙටි පණිවිඩයක් මගින් අදාළ ගනුදෙනුකරු වෙත ඒ බව දැනුම් දෙනු ලැබේ.

ඇ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ මුදල් විශුද්ධිකරණයට එරෙහි අවශ්‍යතා සහ "ඔබේ ගනුදෙනුකරු පිළිබඳව දැනගන්න" (KYC) යන කරුණට අදාළ තොරතුරු පිළිබඳ අවශ්‍යතා අඛණ්ඩව සපුරාලීම සඳහා, යම් ගනුදෙනුකරුවකුගේ FriMi ගිණුමට අදාළ ලියාපදිංචිය සිදු කර අවසන් වූ පසුවත්, එම ගනුදෙනුකරු වෙතින් යම් අමතර ලියකියවිලි සහ තහවුරු කර ගැනීමේ තොරතුරු කලින් කල ඉල්ලා සිටීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ. ඒ සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කරනු ලබන ඉල්ලීමකින් පසුව අදාළ පරිදි සතුටුදායක ලෙස ලියකියවිලි සහ තහවුරු කර ගැනීමේ තොරතුරු සැපයීමට ගනුදෙනුකරු අපොහොසත් වන අවස්ථාවක දී, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට තම තනි අභිමතය අනුව කටයුතු කරමින් ගනුදෙනුකරුගේ FriMi ගිණුම අවහිර කිරීමට හෝ වසා දැමීමට පුළුවන.

ඉ) එකී ගනුදෙනුකරුට පමණක් සම්බන්ධ වන, එහෙත්, වෙනත් අන් කිසිදු පුද්ගලයෙකු හා සම්බන්ධව නොවන, අදාළ නිවැරදි සහ අව්‍යාජ ලියාපදිංචි කිරීමේ තොරතුරු සැපයීම සඳහා ගනුදෙනුකරු වගකිව යුතු ය. එවැනි ලියාපදිංචි කිරීමේ තොරතුරු යාවත්කාලීනව තබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනස්කම් සිදු වූ විට, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත දැනුම් දීම සඳහා ගනුදෙනුකරු වගකීමෙන් බැඳී සිටී. යම් ගනුදෙනුකරුවකුගේ ශ්‍රී ලාංකික නේවාසී තත්ත්වය වෙනස් කිරීම හේතුවෙන් FriMi මූල්‍ය සේවා භාවිත කිරීම සඳහා එකී ගනුදෙනුකරු නුසුදුස්සෙකු බවට පත් වනු ඇත.

ඊ) ගනුදෙනුකරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ තොරතුරු වල ඇති කිසියම් දෝෂ, අත්වැරදීම් සහ සාවද්‍යතාවයන් වෙනස් කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් එවැනි වෙනස්කම් පිළිබඳව කෙරෙන දැනුම්දීම්, FriMi ඇප් එක හරහා සිදු කරනු ලබනවා ඇත. එවැනි වෙනස්කම් බලාත්මක කිරීමට ගනුදෙනුකරු වෙතින් වැඩිදුරටත් කෙරෙන එකඟතාව පළ කිරීමක් අවශ්‍ය නොවන්නේ ය.

5. FriMi මූල්‍ය සේවා

අ) අවසර ලත් විදේශ ගනුදෙනු හැර, FriMi මූල්‍ය සේවා භාවිතා කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින් දේශීය ගනුදෙනු සම්පූර්ණ කිරීමේ කාර්ය සඳහා පමණි.

ආ) FRIMI මූල්‍ය සේවා භාවිතා කළ යුත්තේ, නීත්‍යානුකූල සහ යුක්තිය අරමුණු සඳහා පමණක් වන අතර මෙම නියමයන් සහ කොන්දේසිවල නිඅම කර දක්වා ඇති අවසර ලත් ගනුදෙනු සිදු කිරීම සඳහා පමණි.

ඇ) ගනුදෙනුකරුගේ ගෙවීම් මෙවලමට අනුමැතිය ලබා දුන් පසු, අදාළ ගෙවීම් ගනුදෙනුව සම්පූර්ණ කර මුදා හැර ඇතැයි යනුවෙන් සලකනු ලැබේ. ගෙවීම් මෙවලම් හරහා සිදු කරනු ලබන ගෙවීම් ගනුදෙනු, ගනුදෙනුකරු සහ අදාළ මූල්‍ය ආයතනය සහ/හෝ නිකුත් කරන්නා (**ඩෙබිට්** කාඩ්පතක් හෝ ක්‍රෙඩිට් කාඩ්පතක් සම්බන්ධයෙන්) අතර පවත්නා නියමයන් සහ කොන්දේසි වලට යටත් වේ.

ඈ) ගනුදෙනුකරු විසින් ගෙවීම් මෙවලමක් භාවිතා කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස, එකී ගෙවීම් මෙවලමට අදාළ නියමයන් සහ කොන්දේසි යටතේ පැනවිය හැකි යම් අය කිරීම් සහ ගාස්තු සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුතු ය.

ඉ) FriMi මූල්‍ය සේවා බාධාවකින් තොරව භාවිතා කිරීම සඳහා, නියමිත වේලාවට ගෙවීම් මෙවලම් යාවත්කාලීන කිරීම සහ අලුත් කිරීම සඳහා ගනුදෙනුකරු ඒකාන්ත වශයෙන්ම වගකිව යුතු ය.

ඊ) FriMi ඇප් එක හරහා සකසන ලද සියලුම ගනුදෙනු වලට අදාළ මුදල්, ගනුදෙනුකරු වෙත ආපසු ගෙවනු නොලැබිය හැකි අතර ගනුදෙනුකරුට ද, එකී ගනුදෙනු FriMi ඇප් එක හරහා ආපසු වෙනස් කරනු ලැබිය නොහැකි ය. පහත සඳහන් 8 වන වගන්තියේ දැක්වෙන විධිවිධානවලට යටත්ව, අදාළ ගෙවීම් මෙවලම් පාලනය කරනු ලබන නියමයන් සහ කොන්දේසි යටතේ අමතර මුදල් ආපසු ගෙවීම, ආපසු වෙනස් කිරීම හෝ ආපසු අය කර ගැනීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු සතු අයිතිවාසිකම් තිබිය හැකි ය.

උ) ගනුදෙනුකරුගේ FriMi ගිණුම සහ ඊට සම්බන්ධ ගෙවීම් මෙවලම් භාවිතයෙන් සිදුවන ගනුදෙනු නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතිය ඇත. FriMi ගිණුම සහ/හෝ ඊට සම්බන්ධ ගෙවීම් මෙවලම් හරහා සැකසහිත හෝ අනපේක්ෂිත ගනුදෙනු සිදු වන බවට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව අදහස් කරන්නේ නම්, අදාළ FriMi ගිණුම පවත්වාගෙන යාම අත්හිටුවීමේ අයිතිය ද ඇතුළුව, එම ගනුදෙනු, ගනුදෙනුකරු වෙත දැනුම් දීමකින් තොරව ආපසු හැරවීමේ හෝ අත්හිටුවීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ. එවැනි තත්වයන් යටතේ FriMi ගිණුම වෙත ප්‍රවේශය සීමා කිරීම සම්බන්ධයෙන් වගකීම් දැරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව බැඳී නැත.

උ) 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාතර්‍ා කිරීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති මූල්‍ය බුද්ධි ඒකකය සහ වෙනත් යම් නීති බලාත්මක කරන බලධරයන් සහ සෙසු නියාමකයින් වෙත, අවස්ථාවෝචිත පරිදි, යම් සැක සහිත ගනුදෙනු වාතර්‍ා කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට අයිතිය ඇත.

කිසිදු ගනුදෙනුවක් සිදු නොකරන ලෙස මූල්‍ය බුද්ධි ඒකකය / බලධරයා / නියාමකයා විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත උපදෙස් දෙනු ලබන අවස්ථාවක දී, මූල්‍ය බුද්ධි ඒකකයට / බලධරයාට /නියාමකයාට අවශ්‍ය විමශර්න සිදු කිරීමට ඉඩ දීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අදාළ ගනුදෙනුව අත්හිටුවනු ඇත.

ඉහත කරුණු සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනු ලබන කිසිදු ක්‍රියාමාගර්යක් පිළිබඳව ගනුදෙනුකරුට දැනුම් දීමට ගනුදෙනුකරු හිමිකම් නොලබන අතර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනු ලබන එබඳු යම් ක්‍රියාමාගර්යක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ගනුදෙනුකරු විෂයයෙහි බැඳීමක් හෝ වගකීමක් දරන්නේ නැත.

එ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, කවර හෝ ආකාරයකින් (අභ්‍යන්තරගත සහ බැහැර ගත ප්‍රේෂණ, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියට අදාළ මාරු කිරීම් (SLIPS), තථ්‍ය කාල දළ නිරවුල් කිරීමේ පද්ධතියට අදාළ ගනුදෙනු (RTGS), ක්‍රෙඩිට් කාඩ්පත් ගනුදෙනු, **ඩෙබිට්** කාඩ්පත් ගනුදෙනු සහ විදේශ ව්‍යවහාර මුදල්වලට හා වෙනත් විශේෂ ගිණුම්වලට අදාළ ගනුදෙනු ඇතුළුව) අදාළ රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා සිදු කෙරෙන සෑම මුදල් ගනුදෙනුවක්ම සහ විද්‍යුත් අරමුදල් මාරු කිරීමක්ම, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාතර්‍ා කරනු ලැබිය යුතු වන්නේ ය.

ඉහත කරුණු සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනු ලබන කිසිදු ක්‍රියාමාගර්යක් පිළිබඳව ගනුදෙනුකරුට දැනුම් දීමට ගනුදෙනුකරු හිමිකම් නොලබන අතර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනු ලබන එබඳු යම් ක්‍රියාමාගර්යක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ගනුදෙනුකරු විෂයයෙහි බැඳීමක් හෝ වගකීමක් දරන්නේ නැත.

ඒ) FriMi ඉතුරුම් තුළ ගනුදෙනුකරුගේ බැරට පවත්නා අරමුදල් සඳහා, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ලබන පරිදි, ඊට අදාළ යම් අනුපාතවලට සහ ගෙවනු ලැබිය යුතු ආකාරයකට අනුව වූ පොලියක් ලබා ගැනීමට ගනුදෙනුකරු හිමිකම් ලබනු ඇත. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ තනි අභිමතය පරිදි, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කලට දැනුම් දිය හැකි පරිදි, FriMi ඉතුරුම් ගිණුමට අදාළ ප්‍රසාද පොලී දීමනා සහ අනෙකුත් තිළින දීමනා සඳහා ගනුදෙනුකරු තවදුරටත් හිමිකම් ලබනවා ඇත.

ඔ) තම FriMi ඉතුරුම් ගිණුමේ අවම ශේෂය (තිබේ නම්) පවත්වා ගැනීමට ගනුදෙනුකරු එකඟ වේ.

ඕ) පුද්ගලික ගනුදෙනු සම්පූණර් කිරීමේ කායර්ය සඳහා පමණක් ගනුදෙනුකරුවන් විසින් FriMi මූල්‍ය සේවා භාවිතා කරනු ලබන අතර, වාණිජ අභිප්‍රාය හෝ ආශ්‍රය සහිත ගනුදෙනු කිසිවක් ගනුදෙනුකරුගේ FriMi ගිණුම හරහා සිදු නොකළ යුතු ය.

ක) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පනවනු ලබන අදාළ ගනුදෙනු සීමාවට ගනුදෙනුකරු යටත් වන අතර ඊට අනුකූලව කටයුතු කළ යුතු ය. තමා විෂයයෙහි යම් ගනුදෙනු සීමාවක් පනවා ගැනීමේ විකල්පය තෝරා ගැනීමට ගනුදෙනුකරුට හැකි වන නමුත්, එම සීමා අදාළ ගනුදෙනු සීමා තුළ පැවතිය යුතු වන්නේ ය.

ග) යම් ගෙවීම් ගනුදෙනුවක් ආරම්භ කරන අවස්ථාවේ දී, තම ජංගම උපාංගයට යවනු ලබන සත්‍යාපන පණිවිඩයක් හරහා ගෙවීම් ගනුදෙනුව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා තම ජංගම උපාංගය ඔහු / ඇය සන්තකයේ තබා ගැනීමට ගනුදෙනුකරු එකඟ වේ.

6. ගෙවීම් මෙවලම්

අ) මෙම නියමයන් සහ කොන්දේසි වලට අත්සන් කිරීම මගින්, ගනුදෙනුකරුගේ නමින් FriMi ඉතුරුම් ගිණුමක් විවෘත කරන ලෙස ගනුදෙනුකරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙතින් ඉල්ලා සිටී.

ආ) FRIMI වෙබ් අඩවියෙහි සහ / හෝ FriMi ඇප් එකට අයත් වෙනත් සමාජ මාධ්‍ය වේදිකාවල දක්වා ඇති පරිදි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පිරිවිතරයන්ට අනුකූලව, වෙනත් බැංකුවලින් / මූල්‍ය ආයතනවලින් එන යම් ගෙවීම් මෙවලම්

ගනුදෙනුකරුගේ FriMi ගිණුමට සම්බන්ධ කිරීමට ගනුදෙනුකරුට පිළිවන. ගෙවීම් මෙවලමක් ගනුදෙනුකරුගේ FriMi ගිණුමට සාථර්කව සම්බන්ධ කළ පසු, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරු වෙත FriMi සේවා සැපයීමට අවශ්‍ය විය හැකි අදාළ ගිණුම්වල / කාඩ්පත්වල අංක නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගබඩා කර ගනු ලබනවා ඇත. ගෙවීම් මෙවලම සම්බන්ධයෙන් ගනුදෙනුකරු සහ වෙනත් යම් බැංකු / මූල්‍ය මෙවලම් අතර ඇති කිසිදු ගිවිසුමකට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පාශර්වකරුවෙකු නොවන බවත්, ණය නිකුත් කිරීම හෝ ණය සඳහා සුදුසුකම නිශ්චය කිරීම විෂයයෙහි සම්බන්ධ නොවන බවත් ගනුදෙනුකරු පිළිගනී. එවැනි ගෙවීම් මෙවලම් කිසිවක් සුමට තත්ත්වයේ පවතිනු ඇතැයි යනුවෙන් හෝ FriMi ඇප් එක හරහා සිදුකරන යම් ගෙවීම් ගනුදෙනුවක් සඳහා ඊට අදාළ බැංකුව / මූල්‍ය ආයතනය විසින් බලය දීම හෝ එය අනුමත කිරීම සිදු කරනු ඇතැයි යනුවෙන් යම් කරුණු නියෝජන ඉදිරිපත් කිරීමක් හෝ ඒ පිළිබඳව සත්‍යාපනය කිරීමක් හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සිදු කරන්නේ නැත.

ඈ) නියමිත ගෙවීම් මෙවලමක් සම්බන්ධයෙන් ගනුදෙනුකරුගේ FriMi සේවාවන්ට අදාළ භාවිතය, මෙම නියමයන් සහ කොන්දේසි මගින් මෙන්ම අදාළ ගෙවීම් මෙවලම විවෘත කරන ලද / නිකුත් කරන ලද බැංකුවට / මූල්‍ය ආයතනයට අදාළ නියමයන් / පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති මගින් ද පාලනය වේ. මෙම නියමයන් සහ කොන්දේසි කිසිවක්, එවැනි යම් නියමයන් හෝ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති වෙනස්කම්වලට හසු නොකරයි. යම් නියමයන් සහ කොන්දේසි සහ අදාළ බැංකුවේ / මූල්‍ය ආයතනයේ නියමයන් අතර කිසියම් අනනුකූලතාවක් ඇති වුවහොත්, මෙම නියමයන් සහ කොන්දේසි FriMi ඇප් එකට අදාළ වන ගනුදෙනුකරු සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව අතර පවත්නා සබඳතාවය පාලනය කරනු ඇති අතර, අදාළ බැංකුවේ / මූල්‍ය ආයතනයේ නියමයන්, ගනුදෙනුකරු සහ අදාළ බැංකුව / මූල්‍ය ආයතනය අතර පවත්නා සබඳතාවය පාලනය කරනු ඇත.

ඈ) තම FriMi ගිණුමට සම්බන්ධනය කිරීම සඳහා ගෙවීම් මෙවලම් නම් කිරීම මගින්, ගනුදෙනුකරු විසින් FriMi මූල්‍ය සේවා භාවිතා කරනු ලැබීමේ කායර් අරබයා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයත් හර කිරීමේ සහ බැර කිරීමේ ගෙවීම් මෙවලම්වලට තම කැමැත්ත පළ කරන බවට ගනුදෙනුකරු එකඟ වේ. ගනුදෙනුකරු විසින් ගෙවීම් මෙවලම්වලට අදාළ මෙහෙයුම් උපදෙස්, ගනුදෙනුකරුගේ FriMi සේවාවන් භාවිතා කිරීම හා සමඟ අනුකූල වන බවට ගනුදෙනුකරු විසින් වග බලා ගනු ලැබෙතැයි යනුවෙන්, ගනුදෙනුකරු, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හමුවේ පෙනී සිටියි, ඒ වෙනුවෙන් එකඟ වෙයි සහ ඊට ප්‍රතිඥා දෙයි.

ඉ) තම FriMi ගිණුමට සම්බන්ධනය කිරීම සඳහා ගෙවීම් මෙවලම් තෝරා ගැනීම මගින්, ගනුදෙනුකරු වෙත සපයනු ලැබීමට නියමිත භාණ්ඩ හෝ සේවා සඳහා තෙවන පාශර්වයකට ගාස්තු අය කිරීමට හැකි වනු පිණිස එවැනි ගෙවීම් මෙවලම්වල විස්තර සහ ඊට අදාළ තොරතුරු එකී තෙවන පාශර්වයක් වෙත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ලබා දීම ගනුදෙනුකරු පිළිගන්නා අතර ඊට එකඟතාව ද පළ කරයි. එවැනි අවස්ථාවන්හි දී, එම තෙවන පාශර්වයට එවැනි විස්තර ලබා දීමෙන් පසුව, එම ගනුදෙනුවට අදාළව එකී තෙවන පාශර්වය සමඟ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට තවදුරටත් කිසිදු සම්බන්ධයක් නොමැත. එවැනි තෙවන පාශර්ව ගනුදෙනුවකින් උද්ගත වන ගැටලු සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වගකීම් දරන්නේ නැත. ඒ හා සම්බන්ධ ආරවුල්වල දී, ගනුදෙනුකරු, එවැනි ගෙවීම් මෙවලමක් විවෘත කරනු හෝ නිකුත් කරනු ලැබීමට පාත්‍ර කෙරුනු තෙවන පාශර්වය හෝ මූල්‍ය ආයතනය සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු ය.

ඊ) FriMi ගිණුමෙහි අන්තගර්ත ගෙවීම් මෙවලම් සම්බන්ධ නිවැරදි තොරතුරු (කල් ඉකුත් වීමේ දිනයන් හා යාවත්කාලීන කළ කාඩ්පත් අංක යනාදිය) පවත්වා ගෙන යාම සඳහා ගනුදෙනුකරු වගකිව යුතු ය. ගනුදෙනුකරුගේ FriMi ගිණුම සමඟ ගෙවීම් මෙවලම් ලියාපදිංචි කිරීම සඳහා ගනුදෙනුකරු හට සියලු හිමිකම් සහ බලය ඇති බවට ගනුදෙනුකරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හමුවේ පෙනී සිටියි සහ ඒ වෙනුවෙන් එකඟ වෙයි.

උ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ බැංකු ගිණුමක් (එය, ගෙවීම් උපකරණයක් ලෙස එකතු කරනු ලැබේ) හරහා ගනුදෙනුකරු විසින් උපදෙස් දෙනු ලබන විටක දී, එකී උපදෙස් ක්‍රියාවට නංවනු ලබන්නේ, එවැනි ගිණුමකට අවශ්‍ය බලයලත් අත්සන්කරුවන් FriMi ඇප් එක හරහා ඊට බලය ලබා දුනහොත් පමණි. ඒ අනුව, එවැනි කැමැත්තක් ලබා දීමෙන් අනතුරුව, එහි ප්‍රතිඵලයක් ලෙස සිදු කරනු ලබන ගෙවීම් ගනුදෙනු විෂයයෙහි එක් එක් හවුල් ගිණුම් හිමියන් සන්ධිය වශයෙන් හා තනි තනි වශයෙන් වගකීමට බැඳී සිටී.

## 7. FriMi ඩෙබිට් කාඩ්පත

අ) ගනුදෙනුකරුට **ඩෙබිට් කාඩ්**පතක් අවශ්‍ය වන්නේ නම්, ගනුදෙනුකරු, FriMi ඇප් එක හරහා FriMi භෞතික **ඩෙබිට් කාඩ්**පතක් හෝ FriMi අතථ්‍ය **ඩෙබිට් කාඩ්**පතක් ඉල්ලා සිටිය යුතු ය. FriMi භෞතික **ඩෙබිට් කාඩ්පත** හෝ FriMi අතථ්‍ය **ඩෙබිට් කාඩ්පත** පත, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි තනි අභිමතය පරිදි නිකුත් කරන බව ගනුදෙනුකරු පිළිගනී.

සෑම FriMi **ඩෙබිට් කාඩ්**පතක්ම, ගනුදෙනුකරුට ගෙවීම් ගනුදෙනු සඳහා භාවිතා කිරීමට හැකි වනු පිණිස ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමට (මෙම නියමයන් සහ කොන්දේසිවල නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව) සම්බන්ධනය කරනු ඇත. FriMi ඉතුරුම් ගිණුම, එබඳු ගනුදෙනුවලට අදාළව හර කර දක්වනු ලැබේ.

ආ) FriMi භෞතික **ඩෙබිට් කාඩ්පත** භාවිතා කළ හැක්කේ, "නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ මාස්ටර් කාඩ් ඩෙබිට් කාඩ් පත් දරන්නන්ගේ ගිවිසුමට අදාළ නියමයන් හා කොන්දේසිවලට" යටත්ව පමණි. "නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ මාස්ටර් කාඩ් ඩෙබිට් කාඩ් පත් දරන්නන්ගේ ගිවිසුමේ" නියමයන් සහ කොන්දේසි පිළිගැනීමටත්, ඒවා අනුව බැඳී කටයුතු කිරීමටත් ගනුදෙනුකරු එකඟ වේ.

ඇ) FriMi භෞතික **ඩෙබිට් කාඩ්පත** භාවිතා කිරීම මගින්, ගනුදෙනුකරුට "නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ මාස්ටර් කාඩ් ඩෙබිට් කාඩ් පත් දරන්නන්ගේ ගිවිසුමට අදාළ නියමයන් හා කොන්දේසි", ඊට අදාළ විස්තර ද සමඟ ගනුදෙනුකරුට පැහැදිලි කර දී ඇති බවත්, ගනුදෙනුකරු එකී නියමයන් හා කොන්දේසි සහ එකී විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත් ගනුදෙනුකරු විසින් තහවුරු කරනු ලබන අතර ඊට තම කැමැත්ත පළ කර ඒවා අනුව බැඳී කටයුතු කිරීමට ද ගනුදෙනුකරු එකඟ වේ.

ඈ) මෙම නියමයන් සහ කොන්දේසිවලට අත්සන් කිරීම මගින් :

(i) විදේශ ව්‍යවහාර මුදල්වලින් කෙරෙන ගනුදෙනු සඳහා FriMi **ඩෙබිට් කාඩ්පත** භාවිතා කළ හැකි විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් වලට අදාළ කොන්දේසිවලට යටත්ව, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ("පනත") යටතේ පනවා ඇති කොන්දේසි පිළිබඳව තමා දැන සිටින බව ගනුදෙනුකරු තහවුරු කරන අතර, එකී කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීමට ද ගනුදෙනුකරු පොරොන්දු වේ ;

(ii) FriMi **ඩෙබිට් කාඩ්පත** මගින් ගනුදෙනුකරු විසින් සිදු කරන ලද විදේශ විනිමය ගනුදෙනු පිළිබඳව පනතේ කාර්යයන් සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අවශ්‍ය විය හැකි කිසියම් තොරතුරක් සැපයීමට ගනුදෙනුකරු එකඟ වේ ;

(iii) FriMi **ඩෙබිට් කාඩ්පත** මත බල අවසර නොලත් විදේශ විනිමය ගනුදෙනු සිදු කරන බවට සැක කිරීමට තරම් සාධාරණ හේතු තිබේ නම්, FriMi **ඩෙබිට් කාඩ්පත** මත විදේශ විනිමය ලබා ගැනීම අත්හිටුවීම පිණිසත්, විදේශ විනිමය පාලන දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත අදාළ කාරණය වාතර්ා කිරීම පිණිසත් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ක්‍රියා කළ යුතු යැයි තමා දන්නා බව ගනුදෙනුකරු තහවුරු කරයි ;

(iv) ගනුදෙනුකරු විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වන්නේ නම් හෝ ශ්‍රී ලංකාව හැර යන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, FriMi භෞතික **ඩෙබිට් කාඩ්පත** නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත භාර දී යාමටත්, නේවාසික තත්ත්වයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, ඒ බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත දැනුම් දීමටත් ගනුදෙනුකරු පොරොන්දු වේ, සහ

(v) පහත සඳහන් කටයුතු සඳහා FriMi **ඩෙබිට් කාඩ්පත** භාවිතා නොකිරීමට සපථ වෙයි :

1) විදේශ විනිමය ගනුදෙනු (විදේශ විනිමය වෙළෙඳ කටයුතු) ;
2) අතථ්‍ය ව්‍යවහාර මුදල් ගනුදෙනුවලට අදාළ ගෙවීම් ;
3) ශ්‍රී ලංකාවෙන් පරිබාහිරව ඔට්ටු ඇල්ලීමේ, සූදු ක්‍රීඩා කිරීමේ සහ පරදු තැබීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ ගෙවීම් ;
4) 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ මෙහෙයුම් උපදෙස් සහ එහි යම් සංශෝධනවලට යටත්ව වාණිජමය කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව කරා භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ගෙවීම්.

8. ටෝකන් පත් සහ තෑගි වවුචර් පත්

**I) ටෝකන් පත්**

අ) FriMi වෙබ් අඩවියෙහි සහ/හෝ FriMi ඇප් එකට අයත් වෙනත් සමාජ මාධ්‍ය වේදිකාවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගනුදෙනුකරුගේ යම් සුදුසුකම් ලත් ගෙවීම් මෙවලමක් හරහා ඕනෑම පුද්ගලයෙකු වෙත අරමුදල් යැවීමේ කාර්ය සඳහා ටෝකන් පතක් ඇති කර ගැනීමට ගනුදෙනුකරුවෙකුට පුළුවන.

ආ) ටෝකන් පත්, නිකුත් කළ පසු, ඒවා ආපසු කැඳවිය හැක්කේ, ඒවා ලබන්නා විසින් මුදවා ගැනීමට / භාවිතා කිරීමට පෙර පමණි. කෙසේ වෙතත්, ටෝකන් පත ඒවායේ කල් ඉකුත් වීමට පෙර භාවිතා කර නොමැති නම්, එම ටෝකන් පත කල් ඉකුත් වූ පසු ඊට අදාළ අරමුදල ගනුදෙනුකරුගේ අදාළ ගෙවීම් මෙවලම වෙත ආපසු හරවා යවනු ලැබේ.

ඇ) ගනුදෙනුකරුවෙකු නොවන පුද්ගලයෙකුට FriMi ගිණුම හරහා යම් ගනුදෙනුකරුවෙකු මුදල් යවන්නේ නම්, එම අරමුදල ස්වයංක්‍රීයව ටෝකන් පතකට පරිවතර්නය වේ.

ඈ) ටෝකන් පතක කල් ඉකුත්වන කාලය, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

ඉ) ටෝකන් පත ජනනය කිරීම සඳහා FriMi ඈප් එක වෙත නිවැරදි තොරතුරු ඇතුළත් කර ඇති බව සහතික වනු පිණිස ගනුදෙනුකරු වගකිව යුතු වන්නේ ය.

**II) තෑගි වවුචර් පත්**

අ) යම් ගනුදෙනුකරුවෙකුට, FriMi ඈප් එකෙහි ඇති අදාළ විකල්පය තේරීම මගින් FriMi ඈප් එක හරහා වෙනත් ගනුදෙනුකරුවකු හෝ ගනුදෙනුකරුවකු නොවන පුද්ගලයෙකු වෙත තෑගි වවුචර් පතක් ලබා දිය හැක.

ආ) ගනුදෙනුකරුගේ ගෙවීම් මෙවලම හර කිරීමෙන් තෑගි වවුචරයක් ඇති කර ගත් පසු, තෑගි වවුචරය අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට නොහැකි ය.

ඇ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරන ලද තෑගි වවුචර් පත පිළිබඳ දැනුම්දීමෙහි සපයා ඇති සබැඳිය (link එක) හරහා අදාළ අලෙවිකරුගේ වෙබ් අඩවියට පිවිසීම මගින් හෝ අදාළ වෙළඳ සැලේ දී හෝ තෑගි වවුචර් පතක් ලබා ගත හැකි ය.

ඈ) අලෙවිකරුවෙකු විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කිසිදු ආකාරයකින් වගකීමට බැඳී නැත.

9. ගාස්තු

අ) ආයතනික වෙබ් අඩවියෙහි සහ / හෝ FriMi වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කර ඇති නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ තීරුබදු පොත් පිංචෙහි අඩංගු වන පරිදි, FriMi ඈප් එක භාවිතයට අදාළ (යම් ගාස්තු සහ අවසන් කිරීමේ අයවීම් ඇතුළුව) (“ගාස්තු” ලෙසින් සාමූහිකව සඳහන් වන) අය කිරීම් සහ ගාස්තු (ඇත්නම්), ගනුදෙනුකරු විසින් ඒවා දැරිය යුතු ය. අදාළ ගාස්තු, වරින් වර සංශෝධනය කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

ආ) ගනුදෙනුකරු විසින් FriMi සේවාවන් භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගෙවිය යුතු වන්නා වූ සියලුම බදු, මුද්දර ගාස්තු සහ / හෝ වෙනත් බදු අයවීම් ("බදු" ලෙසින් සාමූහිකව සඳහන් වන) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගෙවිය යුතු ය, එසේ නැතහොත්, ප්‍රතිපූරණය කළ යුතු ය.

ඇ) FriMi **සේවා** භාවිතා කිරීම **විෂයයෙහි අදාළ වන,** ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු ගාස්තු සහ බදු අයවීම් (සාමූහික **වශයෙන්** "ගාස්තු") **හිලව් කර ගැනීම වෙනුවෙන්** ගනුදෙනුකරු **සතුව** නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ ඇති FRIMI ඉතුරුම් ගිණුම හෝ වෙනත් ඕනෑම බැංකු ගිණුම**ක්** හර කිරීම **සඳහා** නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතිය ඇති බවට ගනුදෙනුකරු එකඟ වේ.

ඈ) ගනුදෙනුකරු FriMi සේවාවන් භාවිතා කිරීමේ දී තෙවන පාශර්ව විසින් අය කරනු ලැබිය හැකි සියලුම ගාස්තු සහ අයවීම් සඳහා ගනුදෙනුකරු වගකිව යුතු ය. මෙහිලා මතුවන සැකය මඟහරවා ගනු පිණිස, සම්බන්ධිත ගෙවීම් මෙවලම්වලට අදාළ සේවා වාහකයන් (විදුලි සංදේශ ක්‍රියාකරුවන්) සහ බැංකු / මූල්‍ය ආයතන යනාදිය විසින් අය කරනු ලබන සියලු ගාස්තු සහ අයවීම් දැක්විය හැකි අතර, ඒ සඳහා ගනුදෙනුකරු වගකිව යුතු ය.

10. ගනුදෙනුකරුගේ ව්‍යාපාර

අ) ජංගම උපාංගයේ ආරක්ෂාව ගනුදෙනුකරු සතු වේ.

ආ) ගනුදෙනුකරු, FriMi ඇප් එකෙහි සහ තමාගේ FriMi ගිණුමෙහි රහස්‍යභාවය සහ ආරක්ෂාව පවත්වාගෙන යා යුතු අතර එයට පහත සඳහන් කාර්‍ය කටයුතු ඇතුළත් වේ.

(i) ජංගම උපාංග ආරක්ෂිත ආකාරයකින් ගබඩා කර තබා ගැනීම ;
(ii) පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර රහසිගතව තබා ගැනීම; සහ
(iii) FriMi සේවා වෙත ප්‍රවේශ වීමට භාවිතා කරන ජාත්‍යන්තර ජංගම උපකරණ හඳුනා ගැනීමේ ‘ඉමෙයි’ (IMEI) කේත, පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍රවලින් වෙන්කර වෙනම ස්ථානයක තබා ගැනීම.

ඇ) ගනුදෙනුකරු දායකත්වය ලබා දී ඇති නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිරිනමනු ලබන වෙනත් ඩිජිටල් බැංකු සේවා වෙත ප්‍රවේශ වීම සඳහා අදාළ පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර භාවිතා කළ හැකි බව ගනුදෙනුකරු පිළිගනී. එහෙයින්, යම් කුමන හෝ ආකාරයකින් පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර නිරාවරණයවීමකට ලක්වේ නම්, එම පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර අනවසර ප්‍රවේශ වෙත යොමු වීමට මෙන්ම වෙනත් එබඳු ඩිජිටල් බැංකු සේවාවල පරිහරණයට ද හේතු පාදක වනු ඇත. FriMi සේවාවන් භාවිතා කිරීම නොකඩවා කරගෙන යාමේ දී, එවැනි අවදානමක් ඇතිවීමට ඉඩ සැලසෙන බව ගනුදෙනුකරු මෙයින් පිළිගනී.

ඈ) යම් ජංගම උපාංගයක් නැතිවීම සම්බන්ධයෙන් FriMi සහය සේවා අමතා වහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගනුදෙනුකරු විසින් වාතර්ා කරනු ලැබිය යුතු අතර, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඒ පිළිබඳව ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් ගනුදෙනුකරු කටයුතු කළ යුතු ය.

ඉ) කිසියම් ජංගම උපාංගයක් නැති වූ විට සහ / හෝ ගනුදෙනුකරුගේ FriMi ගිණුමේ රහස්‍යභාවය සහ ආරක්ෂාව අවදානමට ලක්විය හැකි වැඩි ඉඩ කඩක් ඇති අවස්ථාවක දී, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ අවධානය වෙත එබඳු අවස්ථා වහා යොමු කර සිටීම ගනුදෙනුකරුගේ හුදු වගකීම වේ. විශේෂයෙන්ම, එවැනි සිදුවීමක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත වාතර්ා කිරීම සඳහා වහා FriMi සහය සේවා අමතා ගනුදෙනුකරු විසින් වාතර්ා කරනු ලැබිය යුතු අතර, අදාළ ගැටලුව නිවැරදි කිරීම සඳහා හෝ වෙනත් ආකාරයකින් ඒ පිළිබඳව කටයුතු කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරුට ලබා දෙන උපදෙස් අනුගමනය කළ යුතු ය. ගනුදෙනුකරුගේ ජංගම උපාංගයෙහි සහ / හෝ FriMi ගිණුමෙහි රහස්‍යභාවය සහ ආරක්ෂාව පවත්වා ගැනීමට ගනුදෙනුකරු අපොහොසත් වීම හේතුවෙන් ගනුදෙනුකරුගේ FriMi ගිණුම හරහා කිසියම් අනවසර පුද්ගලයකු විසින් සිදු කර ඇති ගනුදෙනු කිසිවක් සඳහා ගනුදෙනුකරු වගකිව යුතු බව, මෙම නියමයන් සහ කොන්දේසි වල සඳහන් අනෙකුත් වගන්ති කෙරෙහි අගතියකින් තොරව, ගනුදෙනුකරු පිළිගනී.

ඊ) කිසියම් ගනුදෙනුකරුවකුගේ FriMi ගිණුමට අයත් අදාළ පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර භාවිතයට ගෙන සියලු ගනුදෙනු සම්පූණර්යෙන් නිම කළ පසු, ඒවා, ගනුදෙනුකරු විෂයයෙහි තීරණාත්මක හා බන්ධිත වන අතර, එවැනි ගනුදෙනු සම්බන්ධයෙන් වන වගකීම ගනුදෙනුකරු විසින් දරනු ලැබිය යුතු ය. ගනුදෙනුකරුගේ FriMi ගිණුමට සහ / හෝ අදාළ පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍රවලට වෙනත් කිසිදු පුද්ගලයෙකුට ප්‍රවේශයක් නොමැති බවට වග බලා ගැනීම ගනුදෙනුකරුගේ වගකීම වේ. එවැනි ප්‍රවේශයක් සඳහා ඉඩ ලබා දෙන්නේ නම්, එය, ගනුදෙනුකරුගේ තනි අවදානම සහ වගකීම මත විය යුතු ය.

උ) ගනුදෙනුකරුගේ FriMi ගිණුමට ප්‍රවේශ වීමට හෝ වෙනත් ආකාරයකින් තම පරිශීලක සම්බන්ධ සාක්ෂි භාවිතා කිරීමට ගනුදෙනුකරු ඉඩ දෙන පුද්ගලයන් විසින් කරනු ලබන යම් සහ සියලු ආකාර ගනුදෙනු සම්බන්ධයෙනුත්, පරිශීලක සම්බන්ධ සාක්ෂි භාවිතා කිරීම හෝ අවභාවිතා කිරීම නිසා සිදු වන අනිටු විපාක සම්බන්ධයෙනුත් ගනුදෙනුකරු වගකිව යුතු ය.

ඌ) FriMi ඇප් එක වෙත ඇතුළත් කරනු ලබන සියලු තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම ගනුදෙනුකරුගේ වගකීම වන අතර, ඒ අනුව, ඒ හරහා ඉටු කරනු ලබන්නේ, ගනුදෙනුකරු විසින් අපේක්ෂා කරනු ලබන ගනුදෙනු බවට එමඟින් සහතික වීමට පුළුවන.

එ) FriMi ගිණුම හරහා සිදු කරනු ලබන ගනුදෙනු කිසිවක් පිළිබඳ සත්‍යාවත් බව වැඩිදුර තහවුරු කිරීම් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අපේක්ෂා කරනු ලැබීම අවශ්‍ය නොවන අතර, ගනුදෙනුකරුවෙකුගේ අදාළ පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර මඟින් වලංගු කෙරෙන උපදෙස් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කිසිදු වගකීමකින් බැඳෙනු නොලැබේ.

ඒ) FriMi ගිණුමේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කලින් කල නිකුත් කරනු ලබන සියලුම ආරක්ෂක පියවරයන් සහ පූවර්ාරක්ෂාවන් ගනුදෙනුකරු විසින් යුහුසුළුව පිළිපැදිය යුතු වන්නේ ය.

ඔ) FriMi ගිණුමට ප්‍රවේශ වීම සඳහා වන මුරපදය (password), ගනුදෙනුකරු සිය කැමැත්තෙන්ම හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබීම මත නිතිපතා වෙනස් කිරීම සඳහා වන වගකීම ගනුදෙනුකරු දැරිය යුතු ය. තම මුරපදය නිතිපතා වෙනස් කර ගන්නා ලෙස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ගනුදෙනුකරුට නිදෙර්ශ කරයි. දැනට පවත්නා මුරපදය වෙනස් කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන විට, ගනුදෙනුකරු එය නොකඩවා භාවිතා කිරීමට තීරණය කරන්නේ නම්, එය කළ යුත්තේ, ගනුදෙනුකරු විසින් දරනු ලබන ස්වකීය තනි අවදානම සහ වගකීම මත ය.

ඕ) FriMi ඇප් එක හරහා යම් ගනුදෙනුවක් සම්පූර්ණ කිරීමෙහිලා ගනුදෙනුකරුගේ අපොහොසත් වීම සම්බන්ධයෙන් පහත දැක්වෙන අවස්ථාවල දී සහ අදාළ නීති රෙගුලාසිවල නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් යම් අවස්ථාවල දී කිසිදු ආකාර වගකීමකින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නොබැඳෙන බව, මෙම නියමයන් සහ කොන්දේසිවල සඳහන් වෙනත් කිසිදු විධිවිධානයක් අගතියට පත්වීමකින් තොරව, නිශ්චිත වශයෙන්ම ගනුදෙනුකරු පිළිගනී :

(i) අදාළ ගනුදෙනුව නිශ්චිත ගනුදෙනුකරු වෙත ලබා දී ඇති FriMi මූල්‍ය සේවා විෂය පථය තුළ නොගැනේ ;

(ii) ස්වකීය පරම අභිමතය පරිදි, අදාළ ගනුදෙනුව සැක සහිත හෝ නීති විරෝධී බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව අදහස් කරයි ;

(iii) අදාළ ගනුදෙනුව, නියමිත ගනුදෙනු සීමාව කඩ කරයි ;

(iv) යම් අලෙවිකරුවකු හෝ සේවා සපයන්නෙකු අදාළ ගනුදෙනුවට ගරු කිරීම ප්‍රතික්ෂේප කරයි;

(v) අදාළ ගනුදෙනුව ක්‍රියාවට නැංවීම සඳහා අදාළ ගෙවීම් මෙවලමෙහි ප්‍රමාණවත් අරමුදල් ගනුදෙනුකරු සතුව නොපවතී ;

(vi) ගනුදෙනුකරු විසින් භාවිතා කරනු ලබන ජංගම උපාංගය FriMi ඇප් එක සමඟ නොගැලපේ නම් හෝ කිසියම් ආකාරයකින් දෝෂ සහිත නම් හෝ FriMi ඇප් එක භාවිතා කිරීම සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් සපුරාලීමට එය අපොහොසත් වන්නේ නම් ;

(vii) අදාළ ගනුදෙනුව සිදු කෙරෙන හෝ ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන යම් අලෙවිකරුවකු සතු උපකරණයක් හෝ සේවා සපයන්නෙකු සතු වෙබ් ඇප් එකක් (වෙබ් යෙදවුමක්) නිසි ලෙස ක්‍රියා නොකරන්නේ නම් ;

(viii) යම් ගෙවීම් මෙවලමක් අලුත් කිරීමට අපොහොසත් වීම ;

(ix) ගනුදෙනුකරු හෝ තෙවන පාශර්වයක් විසින් සපයනු ලබන ගනුදෙනු තොරතුරු වැරදි සහගත හෝ කාලානුරූපී නොවේ නම් ; හෝ

(x) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පාලනයෙන් පරිබාහිර තත්වයන් (ගංවතුර හෝ ගිනි හානි ඇතුළත් වන නමුත්, ඊට සීමා නොවන තත්වයන්) හේතුවෙන් කිසියම් අවස්ථාවක දී FriMi ඇප් එක භාවිතයට ගනු ලැබිය නොහැකි නම්.

ක) FriMi ඇප් එක හරහා සිදු කරන සියලු ගෙවීම් ගනුදෙනු තත්‍ය කාලීනව ක්‍රියාත්මක වන බව ගනුදෙනුකරු පිළිගනී. ඒ අනුව, ගනුදෙනුකරු FriMi ඇප් එක වෙත ප්‍රවේශ වූ පසු, එක් එක් ගෙවීම් මෙවලම් සඳහා අදාළ වන නියමයන් සහ කොන්දේසිවල ප්‍රකාශිතව දක්වා ඇති කරුණු හැර, කිසිදු ගෙවීම් ගනුදෙනුවක් නැවැත්වීමට හෝ ආපසු හැරවීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව භාර නොගනී.

ග) FriMi ඇප් එක භාවිතයෙන් අලෙවිකරුවන් හෝ සේවා සපයන්නන් සමඟ ගනුදෙනුකරු සිදු කර ඇති කිසිදු ගනුදෙනුවක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වගකීමෙන් බැඳෙන බවට ගනුදෙනුකරුට හිමිකම් කිව නොහැකි ය. එබඳු ගනුදෙනුවක් සිදු වන අවස්ථාවක දී ගනුදෙනුවක සියලු අංග සම්පූර්ණ කිරීම තහවුරු කිරීම සඳහා පියවර ගැනීම ගනුදෙනුකරුගේ වගකීම වේ. (එනම්, FriMi ඇප් එක හරහා අදාළ ගනුදෙනුව සිදු කිරීමත් සමඟ භෞතික ගෙවීම හෝ මුදල් භාර ගැනීම හෝ භාණ්ඩ / සේවා සැපයීම එකවර සිදු කළ යුතු ය.)

ච) අලෙවිකරුවෙකු විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

ජ) FriMi ඇප් එක හරහා තම බැංකු නිපැයුම් කිසිවක් හෝ යම් තෙවන පාශර්වීය නිපැයුමක් ගනුදෙනුකරු විෂයයෙහි ප්‍රවර්ධනය කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට හිමිකම් ඇත.

ට) FriMi ඇප් එක හරහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයත් අලෙවි ද්‍රව්‍ය විද්‍යුත් මාගර්යෙන් ප්‍රදශර්නය කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

ඩ) FriMi සේවාවන් වෙත ප්‍රවේශ වීමට සහ / හෝ ඒවා භාවිතා කිරීමට හැර වෙනත් කාර්යයන් සඳහා FriMi ඇප් එක ගනුදෙනුකරු විසින් භාවිතා නොකළ යුතු ය.

ණ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පූර්ව ලිඛිත අවසරයකින් තොරව FriMi ඇප් එක සහ එහි අඩංගු තොරතුරු නිරීක්ෂණය කිරීම හෝ පිටපත් කිරීම සඳහා කිසිදු ස්වයංක්‍රීය උපාංගයක් හෝ අතින් සිදු කෙරෙන ක්‍රියාවලියක් ගනුදෙනුකරු විසින් භාවිතා නොකළ යුතු ය.

ත) ගනුදෙනුකරු විසින් පාලනය කරන ජංගම උපාංගයක් හරහා FriMi ඇප් එක භාවිතා කිරීම සඳහා ගනුදෙනුකරුට සීමිත, අවලංගු කළ හැකි, පැවරිය නොහැකි, අනන්‍ය නොවන අයිතියක් ලබා දී ඇත. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට මෙම අයිතිය ඕනෑම වේලාවක සහ හේතු කිසිවක් සහිතව / රහිතව අවසන් කළ හැකි ය. FriMi ඇප් එක සතු හා ඊට සම්බන්ධ සියලුම අයිතිවාසිකම්, හිමිකම් සහ අභිලාෂයන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව තම භාරයේ රඳවා තබා ගනී.

ද) FriMi ඇප් එක නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ/orits සේවා සපයන්නන්ගේ විශ්වාස්‍ය වෙළඳ රහසක් ලෙස පවතින බව ගනුදෙනුකරු පිළිගනී. ගනුදෙනුකරු FriMi ඇප් එකෙහි සම්පූර්ණ හෝ කිසියම් කොටසක් සංස්කරණය කිරීම, වෙනස් කිරීම, අමුතු කිරීම, අනුවර්තනය කිරීම, පරිවර්තනය කිරීම හෝ වෙනත් ආකාරයකින් වෙනස් කිරීම හෝ FriMi ඇප් එකෙහි යම් කොටසක් වෙනත් මෘදුකාංග / යෙදුම් (ඇප්) සමඟ ඒකාබද්ධ කිරීමට හෝ ඒවාට ඇතුළත් කිරීමට ඉඩ නොදිය යුතු ය හෝ FriMi ඇප් එක විසංයෝජනය කිරීම, කොටස්වලට වෙන්කිරීම හෝ ප්‍රතිලෝම ලෙස ඉන්ජිනේරුකරණය කිරීම නොකළ යුතු ය හෝ ඒ හා සමාන ස්වභාවයේ කිසියම් ක්‍රියාවක් කිරීමට උත්සාහ නොකළ යුතු ය.

න) ගනුදෙනුකරු විසින් FriMi ඇප් එකෙහි ආරක්ෂිත විශේෂාංග කිසිවක් ඉවත් කිරීම, මග හැරීම, අක්‍රිය කිරීම, හානි කිරීම හෝ ඊට වෙනත් ආකාරයකින් අතුරු බාධා පැමිණවීම නොකළ යුතු ය හෝ පරිශීලක සත්‍යාපනය හෝ කිසියම් සත්කාරකයක, ජාලයක හෝ ගිණුමක ආරක්ෂාව මග හැරීම ("ක්‍රැක් කිරීම" හෝ "හැක් කිරීම" ලෙස හැඳින්වෙන) නොකළ යුතු ය.

ප) අතින් හෝ ස්වයංක්‍රීයව ක්‍රියා කරන ආම්පන්න (හිමිකාර හෝ තෙවන පාශර්වීය ආම්පන්න) භාවිතයෙන් FriMi ඇප් එකෙහි ඇති ආරක්ෂක පාලන පිහිටුම් හෝ අංගවින්‍යාස පරිලෝකනය කිරීම හෝ තක්සේරු කිරීම ගනුදෙනුකරු විසින් නොකළ යුතු ය.

බ) ගනුදෙනුකරු විසින් පහත සඳහන් දෑ නොකළ යුතු ය :

(i) ඕනෑම වාණිජ හෝ වාණිජ නොවන කාර්යයක් සඳහා FriMi ඇප් එක ප්‍රතිනිෂ්පාදනය කිරීම, පිටපත් කිරීම, බෙදා හැරීම, නැවත විකිණීම හෝ වෙනත් ආකාරයකින් භාවිතා කිරීම ;

(ii) කිසියම් තෙවන පාශර්වයක් වෙනුවෙන් හෝ එහි ප්‍රයෝජනය සඳහා FriMi ඇප් එක භාවිතා කිරීම පිණිස යම් තෙවන පාශර්වයකට ඉඩ දීම ;

(iii) අදාළ දේශීය, ජාතික හෝ ජාත්‍යන්තර නීති කිසිවක් උල්ලංඝනය කරන කවර හෝ ආකාරයකින් FriMi ඇප් එක භාවිතා කිරීම ;

(iv) මෙම නියමයන් සහ කොන්දේසි කඩ කිරීමක් ලෙස නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සලකනු ලබන ඕනෑම කටයුත්තක් සඳහා FriMi ඇප් එක භාවිතා කිරීම ;

(v) FriMi ඇප් එකෙහි ඕනෑම කොටසකට අධි සබැඳියක් (hyperlink එකක්) සකසා පිහිටුවා ගැනීම ;

(vi) FriMi ඇප් එක හරහා දැනුවත් ලෙස හෝ නොසැලකිලිමත් ලෙස නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පද්ධතිවලට හෝ වෙනත් ගනුදෙනුකරුවන්ට අනර්ථයක් හෝ හානියක් සිදු කළ හැකි හෝ සිදුවිය හැකි ඕනෑම විද්‍යුත් අන්තගර්තයක් (වෛරස් ඇතුළුව) කවර හෝ ප්‍රමාණයකින් යුතුව සම්ප්‍රේෂණය කිරීම;

(vii) FriMi ඇප් එකෙහි අඩංගු කිසියම් ප්‍රකාශන හිමිකමක්, වෙළඳ ලකුණක් හෝ වෙනත් බුද්ධිමය දේපළ හිමිකම් දැන්වීම් කිසිවක් ඉවත් කිරීම, අපැහැදිලි කිරීම හෝ වෙනස් කිරීම; සහ/හෝ

(viii) ජංගම උපාංගයෙන් බැහරව හෝ මෙහෙයුම් පද්ධති විකුණුම්කරුට (vendor හට) සහාය දක්වන හෝ සහතික කරන ලද වින්‍යාසයන්ගෙන් පරිබාහිරව වෙනස් කර ඇති යම් උපාංගයක් හෝ මෙහෙයුම් පද්ධතියක් මත FriMi ඇප් එක භාවිතා කිරීම. - මෙයට "ජේල් බ්‍රෝකන්" හෝ "රූටඩ්" උපාංග ඇතුළත් වේ. මෙම නියමයන් සහ කොන්දේසිවල කාර්යයන් සඳහා, "ජේල් බ්‍රෝකන්" හෝ "රූටඩ්" උපාංගයක් යන්නෙන්, ගනුදෙනුකරුගේ ජංගම සේවා සපයන්නා සහ දුරකථන නිෂ්පාදකයා විසින් ඔවුන්ගේ අනුමැතියකින් තොරව එය මත පනවා ඇති සීමාවන්ගෙන් නිදහස් කර ඇති උපාංග කිසිවක් අදහස් කෙරේ.

**(ix) රහස්‍යභාවය**

අ) FriMi වෙබ් අඩවිය, ආයතනික වෙබ් අඩවිය සහ / හෝ FriMi ඇප් එක පිළිබඳ තොරතුරු සහ වාතර්ා සහ ඒවායේ හැඩයම, ආකෘතිය, මාදිලිය හෝ සම්පාදනය කිරීමේ, තේරීමේ, වින්‍යාස කිරීමේ, ඉදිරිපත් කිරීමේ සහ ප්‍රකාශ කිරීමේ ක්‍රමය (සාමූහිකව ගත් කළ, "රහස්‍ය තොරතුරු") නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ / හෝ තෙවන පාශර්ව ("තොරතුරු සපයන්නන්") සතු දේපළ වේ.

ආ) ගනුදෙනුකරු, පහත සඳහන් දෑ කිසිවක් නොකළ යුතු ය හෝ එවැනි කිසිවක් කිරීමට උත්සාහ නොකළ යුතු ය : (i) කවර හෝ ආකාරයකින් හෝ කුමන හෝ මාගර්යකින් වෙනත් පුද්ගලයෙකු දැනුවත් වන පරිදි රහස්‍ය තොරතුරු පළ කිරීම, ප්‍රදශර්නය කිරීම, දැනුම් දීම, බෙදාගැනීම, බෙදා හැරීම, සම්ප්‍රේෂණය කිරීම, විකාශනය කිරීම, කේබල් මගින් විකාශනය කිරීම, ප්‍රතිනිෂ්පාදනය කිරීම, විකිණීම හෝ ප්‍රචලිත කිරීම ; (ii) කිසියම් වෙළඳ ලකුණක් හෝ ප්‍රකාශන හිමිකම් දැන්වීමක් ඇතුළුව යම් රහසිගත තොරතුරක් මත පවත්නා හෝ පෙන්නුම් කර දැක්වෙන යම් හිමිකාර සලකුණු කිරීමක් කවර හෝ ආකාරයකින් ඉවත් කිරීම, මකා දැමීම, වෙනස් කිරීම හෝ සැඟවීම ; සහ (iii) කිසියම් රහසිගත තොරතුරක් වෙනත් යම් වැඩසටහනකට හෝ තොරතුරකට අන්තගර්ත කිරීම හෝ ඒකාබද්ධ කිරීම.

ඇ) රහස්‍ය තොරතුරුවලට (සියලු ප්‍රකාශන හිමිකම, පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු, සේවා ලකුණු, හිමිකාර දේපළ, වෙළඳ රහස් සහ සුවිශේෂී කෘත්‍යයන් ඇතුළුව) සහ ඒවාට අදාළ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ අභිලාෂයන් පිළිවෙළින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ තොරතුරු සපයන්නන් සතු සුවිශේෂී දේපළ වන බවටත්, ඔවුන් භාරයේ ඒවා පවත්නා බවටත් ගනුදෙනුකරු එකඟ වේ.

ඈ) තොරතුරු සහ වාතර්ා පරිශීලනය කිරීම සඳහා පමණක් ලබා දී ඇත. ඒවා වෙළඳ කටයුතු හෝ වෙනත් කායර්යන් සඳහා අපේක්ෂිත නොවන්නේ ය. ගනුදෙනුකරු වෙත කිසියම් තොරතුරක් හෝ වාතර්ාවක් ලබා දීම යන කාරණය මගින්ම, කිසියම් නිපැයුමක අලෙවිය සම්ප්‍රයාවනය කර සිටීමක් හෝ ඒ සම්බන්ධයෙන් නිදෙර්ශ කිරීමක් එහිලා සමන්විත නොවන්නේ ය.

ඉ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හෝ තොරතුරු සපයන්නන් කිසිවකු විසින්, යම් තොරතුරක හෝ වාතර්ාවක නිරවද්‍යතාවය, විශ්වසනීයත්වය, ප්‍රමාණවත් බව, කාලෝචිත බව හෝ සම්පූණර්ත්වය හෝ ඒවා කිසියම් කායර්යක් සඳහා සුදුසු බව තහවුරු කිරීම හෝ සහතික කිරීම සිදු නොකරයි. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හෝ තොරතුරු සපයන්නන් කිසිවකු, ගනුදෙනුකරු හෝ වෙනත් යම් පුද්ගලයෙකු වෙත ලබා දෙන කිසියම් තොරතුරක් හෝ වාතර්ාවක් සම්බන්ධයෙන් කිසිදු බැඳීමක් (වරදමය කඩවීම් හෝ ගිවිසුම් හෝ වෙනත් යම් ආකාරයෙන් වන බැඳීමක් වුවද නොවූවද) නොදරන්නේ ය.

ඊ) ගනුදෙනුකරු විසින් පාලනය කරනු ලබන ජංගම උපාංගයක් හරහා FriMi සේවාවන් භාවිතා කිරීම සඳහා සීමිත වූ ද, අවලංගු කළ හැකි වූ ද, පැවරිය නොහැකි වූ ද, අනන්‍ය නොවන්නා වූ ද අයිතියක් පමණක් ගනුදෙනුකරු හට ලබා දී ඇත. මෙම අයිතිය, ඕනෑම අවස්ථාවක සහ කිසිදු හේතුවක් සහිතව / රහිතව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අවසන් කරනු ලැබිය හැකි ය.

11. නිෂ්පාදන පිළිබඳව සහතිකකරණයක් නොමැති වීම

පහත දැක්වෙන කරුණු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නියෝජනය නොකරන හෝ අනුමත නොකරන අතර ඒ සම්බන්ධයෙන් වගකීමක් ද දරනු නොලැබේ :

(i) යම් අලෙවිකරුවෙකුගේ හෝ සේවා සපයන්නෙකුගේ හෝ තෙවන පාශර්වීය සැපයුම්කරුවෙකුගේ (FriMi ඇප් එක හා සම්බන්ධ විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්, මූල්‍ය ආයතන, සිල්ලර වෙළෙන්දන් ඇතුළු වන නමුත් ඊටම සීමා නොවන අයගේ) විශ්වසනීයත්වය හෝ කායර් සාධනය ;

(ii) FriMi ඇප් එක හරහා සලසා දෙනු ලබන, ගබඩා කරනු ලබන සහ / හෝ මුදවා ගනු ලබන කිසියම් නිෂ්පාදනයක, සේවාවක, අපර්ණයක, ලෝයල්ටි වැඩසටහනක, හෝ වෙනත් අයිතමවල හෝ FriMi ඇප් එක හරහා ප්‍රදශර්නය කරනු ලබන හෝ බෙදා හරිනු ලබන, මිල දී ගනු ලබන හෝ ගෙවනු ලබන යම් උපදෙසක, මතයක, අපර්ණයක, යෝජනාවක, ප්‍රකාශයක, දත්තයක හෝ වෙනත් තොරතුරක (සාමූහික වශයෙන් ගත් කළ, "අන්තගර්තයක") ආරක්ෂාව, වෙළඳාම් කළ හැකි ගුණාත්මකභාවය, යම් කායර්යක් සඳහා වන යෝග්‍යතාව, උල්ලංඝනය කිරීම, නිරවද්‍යතාවය, විශ්වසනීයත්වය, අඛණ්ඩතාව හෝ නීත්‍යානුකූලභාවය; හෝ

(iii) FriMi ඇප් එක භාවිතයෙන් නිෂ්පාදන සහ සේවා මිලදී ගැනීමට හෝ මුදවා ගැනීමට ගනුදෙනුකරුට ඇති හැකියාව. FriMi ඇප් එකෙහි ඇති යම් අන්තගර්තයක තිබිය හැකි දෝෂ හෝ අත්හැරීම් සම්බන්ධයෙන් කිසිදු බැඳීමක් හෝ වගකීමක් දැරීම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව මෙයින් වියාචනය කර සිටියි. යම් ප්‍රතිරෝධිය, වැරදි සහගත, නීති විරෝධී, වංචනික හෝ මෙම නියමයන් සහ කොන්දේසි වෙනත් ආකාරයකින් උල්ලංඝනය කරන අන්තගර්තයක් සම්පූණර්යෙන් හෝ අධර් වශයෙන් ස්වකීය තනි සහ පරම අභිමතය පරිදි සංස්කරණය කිරීමට, වෙනස් කිරීමට, පළ කිරීම හෝ ඉවත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට ඇති අයිතිය, ඒ සම්බන්ධයෙන් තමන් බැඳෙන කිසිදු වගකීම් දැරීමකින් තොරව, තමන් සතුව තබා ගනී.

12. නිවේදනය කිරීම්, උපදෙස් සහ නියමිත ආකාරය

අ) FriMi **ඇප් එක** සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කරනු ලබන නිවේදන (FriMi **ඇප් එක** භාවිතය සඳහා වන නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීම, ඊට අදාළ ගාස්තු සහ අයවීම් ප්‍රකාශයට පත් කිරීම සහ මෙහෙයුම් උපදෙස් ඇතුළුව), ජංගම උපාංග අංක වෙත කලින් කලට යැවෙන කෙටි පණිවිඩ මගින්, ගනුදෙනුකරුගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට යැවෙන විද්‍යුත් තැපැල් පණිවිඩ මගින්, FriMi **ඇප් එක** හරහා කෙරෙන දැනුම්දීම් මගින්, FriMi වෙබ් අඩවිය තුළ කෙරෙන පළකිරීම් මගින් හෝ තම තනි අභිමතය පරිදි සුදුසු යැයි සලකන වෙනත් ආකාරයක් මගින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. / ලබා දෙනු ලැබේ.
නිවේදනය කිරීම්, ගනුදෙනුකරු විෂයයෙහි වහා වගකීම් බැඳීමක් ඇති කරනු ඇත. ගනුදෙනුකරු, එවැනි නිවේදන විද්‍යුත් ආකාරයෙන් ලැබීමට එකඟව ඊට කැමැත්ත පළ කරන අතර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කරනු ලබන එවැනි දැනුම්දීම්, ඉහත විස්තර කර ඇති ක්‍රම මගින් විවෘත කර සමාලෝචනය කර බැලීම ගනුදෙනුකරුගේ වගකීම වේ. ගනුදෙනුකරු විසින් FriMi ඇප් එක හා සබැඳි සේවාවන් අඛණ්ඩව භාවිතා කිරීම, එහිලා කලින් කලට ක්‍රියාත්මක කරන නියමයන් සහ කොන්දේසි සඳහා වන යම් සංශෝධන ගනුදෙනුකරු විසින් පිළිගැනීමක් ලෙස සලකනු ලැබේ.

ආ) FriMi ඇප් එක හරහා සහ / හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ ලියාපදිංචි වී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත යවනු ලබන උපදෙස්, ඉල්ලීම් හෝ දැනුම්දීම් (**සාමූහික වශයෙන් ගත් කළ**, "උපදෙස්"), ගනුදෙනුකරුගේ බල අවසරය, දැනුවත්කම හෝ කැමැත්ත මත ඒවා සිදු කරන ලද්දේ ද නැද්ද යන්න නොසලකා, ගනුදෙනුකරු මත බැඳී පවතින අතර, එවැනි උපදෙස් මත ක්‍රියා කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගනුදෙනුකරු මෙයින් බලය පවරයි. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, තමන් විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයට එවැනි උපදෙස් මත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සහ / හෝ එම උපදෙස් සත්‍යාපනය කර ගැනීමේ තනි අභිමතය තමන් සතුව තබා ගනී.

ඇ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අවශ්‍ය යැයි ඉල්ලා සිටින්නේ නම්, ගනුදෙනුකරු විසින් විද්‍යුත් තැපැල් උපදෙස් අඩංගු ලේඛන කිසිවක මුල් පිටපත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු අතර ගනුදෙනුකරු විසින් එවැනි මුල් පිටපතක් එවා නොතිබීම නිසා උද්ගත වන යම් අවදානම්, පාඩු හෝ බැරකම් ගනුදෙනුකරු විසින් දරා ගනු ලැබිය යුතු ය.

ඇ) අදාළ උපදෙස් ප්‍රකාරව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සහ ඊට ආනුෂාංගික වන්නා වූ සියලු මුදල්, ගාස්තු, අයවීම් සහ වියදම්, ඒවා ගෙවන ලෙස ඉල්ලා සිටි විට, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගනුදෙනුකරු විසින් ගෙවනු ලැබිය යුතු ය. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ ගනුදෙනුකරු විසින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමක් හර කිරීම මගින් එවැනි ගෙවීම් පියවා ගැනීම සඳහා ගනුදෙනුකරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත අනතෝසිකර ආකාරයේ බලයක් පවරයි.

ඉ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට එරෙහිව ගෙන ආ හැකි හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අත් විඳීමට සිදු විය හැකි හෝ ඊට දරනු ලැබීමට සිදු විය හැකි හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අදාළ උපදෙස් පිළිගනු ලැබීම මගින් හෝ ඒ හා සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව පැන නැගිය හැකි සියලු ක්‍රියා, පරිපාටිකර, හිමිකම් පෑම්, පාඩු, හානි, පිරිවැය සහ වියදම් වලින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව මත මුක්තිදානය සලසා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ගලවා ගැනීමටත්, ඒ වෙනුවෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත වන්දි පූරණය කර දීමටත් ගනුදෙනුකරු පොරොන්දු වී කටයුතු කරයි.

ඊ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි, උපදෙස් කිසිවක් ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවත්, ඒ හේතුවෙන් ගනුදෙනුකරුට සිදුවන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කිසිදු වගකීමකින් නොදරන බවත් ගනුදෙනුකරු පිළිගනී.

උ) FriMi ගිණුමේ මෙහෙයුම් අවහිර කිරීම, වෙනස් කිරීම, අමුතු කිරීම හෝ නැවත ආරම්භ කිරීම සඳහා වන යම් උපදෙසක් ක්‍රියාවට නැංවීම සිදු වන්නේ, එවැනි උපදෙස් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සත්‍යාපනය කර ගනු ලැබීමෙන් මෙන් පසුව පමණි.

ඌ) ගනුදෙනුකරු විසින් දෙනු ලබන උපදෙස්, මට අයත් කිසියම් ගිණුමකින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන වෙනත් ගිණුමක් වෙත (ගිණුම් වෙත) හෝ මගේ නමින් හෝ වෙනත් යම් පුද්ගලයෙකුගේ නමින් වෙනත් මූල්‍ය ආයතනයක් වෙත මුදල් ගෙවීම හෝ පවරා මාරු කිරීම හෝ අදාළ පොලී අනුපාතය සහ කාලසීමාව තහවුරු කිරීම ඇතුළත් වන මගේ නමින් ඇති යම් කාල නිශ්චිත තැන්පතුවක් අලුත් කිරීම, ආපසු ගැනීම හෝ අවලංගු කිරීම යන කටයුතු ඇතුළුව, දැනට පවත්වාගෙන යනු ලබන හෝ මින් ඉදිරියට වරින් වර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ මවිසින්පවත්වාගෙන යනු ලබන කිසියම් ගිණුමකට අදාළ විය හැකි ය.

එ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින්, සිය FriMi සහය සේවය (FriMi Assistance), FriMi වෙබ් අඩවිය සහ / හෝ FriMi ඇප් චැට්බොට් සේවය හරහා, ජංගම දුරකථන නැතිවීම් සහ සේවා අවසන් කිරීමේ දැනුම්දීම් වලට සීමා නොවූ සිදුවීම් ඇතුළු නිශ්චිත සිදුවීම්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ගනුදෙනුකරු දැනුම් දිය යුතු නියමිත ආකාරය සහ ආකෘතිය අනුව අවශ්‍ය උපදෙස් සහ තොරතුරු ලබා දෙනු ඇත.

ඒ) ප්‍රකාශ :

(i) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ වෙනත් ආකාරයකින් එකඟ වී ඇත්නම් මිස, FriMi ඉතුරුම් ගිණුමට අදාළ වාරමය ශේෂ ප්‍රකාශ (මාසිකව හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් කාල පරතර අනුව) ගනුදෙනුකරුගේ නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයක් වෙත විද්‍යුත් ආකාරයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිකුත් කරනු ලබනවා ඇත. ගනුදෙනුකරුට අවශ්‍ය වන්නේ නම්, ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත දැනුම් දෙනු ලබන පරිදි එකී ප්‍රකාශවල භෞතික ප්‍රකාශ ලබා ගැනීමේ විකල්පය තෝරා ගැනීමට හැකි වන අතර, එම ප්‍රකාශ ලබා දීම, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි සාමාන්‍ය ගාස්තු ක්‍රමය ප්‍රකාරව වූ නියමිත ගාස්තු ගෙවීමට යටත් වන්නේ ය.

(ii) ගනුදෙනුකරුට ලැබෙන වාරමය ශේෂ ප්‍රකාශයක සාවද්‍ය භාවය හෝ අසම්පූර්ණ භාවය සම්බන්ධයෙන් ගනුදෙනුකරුට යම් විරෝධතාවක් වේ නම්, ඒ බව, කඩිනමින් මතු කළ යුතු නමුත්, කවර හෝ අවස්ථාවක, එවැනි ප්‍රකාශයක් ගනුදෙනුකරු වෙත ලැබීමෙන් පසු දින තිහක් (30 ක්) ඇතුළත ඒ පිළිබඳ විරෝධතාව ලිඛිතව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ලැබිය යුතු ය. එබඳු ප්‍රකාශයක් ලැබී නොමැති කල්හි, එකී ප්‍රකාශය නිවැරදි යැයි සලකනු ලබන අතර එය, ගනුදෙනුකරු මත බැඳී පවතී.

(iii) ගිණුම් ප්‍රකාශ (ඉහත සඳහන් කාල පරතර සහිත ශේෂ ප්‍රකාශයන් හැර), ගනුදෙනු ප්‍රකාශ, දැන්වීම්, නියෝග ඉටු කිරීම් සහ FriMi ඉතුරුම් ගිණුම හරහා සිදු කරන ගනුදෙනුවලට අදාළ වෙනත් ප්‍රකාශ සහ තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පිළිබඳව ගනුදෙනුකරු විසින් වහා පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, කිසියම් විරෝධතාවක් තිබේ නම්, ඒ බව, කඩිනමින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. එසේ

දැනුම් දීමක් කර නොමැති විට, එකී අදාළ ප්‍රකාශ, දැන්වීම්, සහ තොරතුරු ගනුදෙනුකරු මත බැඳී පවත්නා බව සලකනු ලැබේ.

13. ආරවුල් නිරාකරණය

අ) ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන විමසීම්, ඔවුන්ගේ ආරවුල් සහ පැමිණිලි (එක්ව ගත් කළ, "ආරවුලක්" ලෙස හැඳින්වෙන) සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ කායර්ය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් FriMi සහය සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලබනවා ඇත.

ආ) FriMi සේවාවන් සම්බන්ධයෙන් යම් ආරවුලක් ඇති වුවහොත්, ගනුදෙනුකරු FriMi සහාය සේවා මධ්‍යස්ථානය ඇමතීමෙන් ඒ බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත වාතර්ා කළ යුතු අතර, ආරවුල පිළිබඳව විමශර්නය කරනු පිණිස සහ ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාගර් ගනු පිණිස, එය, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයත් අදාළ දෙපාතර්මේන්තුව හෝ අංශය වෙත යොමු කරනු ලැබේ. සියලු පැමිණිලි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අධීක්ෂණය කර ඒ පිළිබඳව නිසි පරිදි පසු විපරම් කරනු ලබනවා ඇත.

ඇ) ආරවුල සම්බන්ධයෙන් වාතර්ා කළ දින සිට වැඩ කරන දින තුනක් (3 ක්) ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ආරවුල පිළිබඳව ගනුදෙනුකරු වෙත ප්‍රතිචාර දක්වනු ලබනවා ඇත. මෙම කාල සීමාව තුළ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට ආරවුල පිළිබඳ විමශර්නය අවසන් කිරීමට නොහැකි වූ අවස්ථාවක දී, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් එවැනිම වැඩ කරන දින තුනක (3 ක) කාල සීමාවක් තුළ ගනුදෙනුකරුට අතුරු පිළිතුරක් ලබා දෙන අතර අදාළ ආරවුල සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අවසන් පිළිතුර ලබා දෙන දිනය පිළිබඳව ද ගනුදෙනුකරු වෙත එමගින් දැනුම් දෙනු ඇත. ගනුදෙනුකරුගේ ආරවුල යුක්ති සහගත එකක් බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නිගමනය කරන්නේ නම්, එකී පිළිතුර මගින්ම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ඊට ප්‍රතිචාර දක්වමින් ආරවුල විසඳීමට ගෙන ඇති පියවර පිළිබඳව ගනුදෙනුකරු දැනුම්වත් කරනු ඇත. ආරවුලක් සම්බන්ධයෙන් වාචිකව හෝ ලිඛිතව ප්‍රතිචාර දැක්වීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට පිළිවන. සියලු ආරවුල්වලට, ඒවා වාතර්ා කරන ලද භාෂා මාධ්‍යයෙන්ම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් පිළිතුරු ලබා දෙනවා ඇත.

ඈ) FriMi සේවා ශ්‍රී ලංකාවේ අධිකරණවල අධිකරණ බලයට යටත් වේ.

14. අත්හිටවීම හෝ අවසන් කිරීම

අ) ගනුදෙනුකරු FriMi ගිණුම අක්‍රිය කිරීමට අපේක්ෂා කරන්නේ නම්, FriMi සහාය සේවා මධ්‍යස්ථානය අමතා එහි සපයා ඇති උපදෙස් අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරුට එය ඒ අයුරින් ඉටු කරවා ගත හැක. ගනුදෙනුකරුට ජංගම උපාංගයක් අක්‍රිය කිරීමට හෝ ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා ළඟම ඇති ශාඛාව වෙත යාමට හෝ FriMi සහාය සේවා මධ්‍යස්ථානය ඇමතීමට හෝ FriMi ඇප් එකෙහි ඇති සේවා ඉල්ලා සිටීමේ විශේෂාංගය හරහා ඉල්ලීමක් යැවීමට හෝ හැකි ය.

ආ) FriMi ගිණුමෙන් කිසියම් ගෙවීමේ මෙවලමක් අක්‍රිය කිරීමට හෝ ඉවත් කිරීමට ගනුදෙනුකරු අපේක්ෂා කරන්නේ නම්, සහාය සේවා මධ්‍යස්ථානය අමතා එහි සපයා ඇති උපදෙස් අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරුට එය ඒ අයුරින් ඉටු කරවා ගත හැක.

ඇ) FriMi ගිණුම අක්‍රිය කිරීමට හෝ අවසන් කිරීමට පෙර යම් හිඟ ගාස්තු සහ/හෝ බදු අයකිරීම් කිසිවක් තිබේ නම්, ගනුදෙනුකරු ඒවා ගෙවිය යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, එවැනි ගාස්තු සහ / හෝ බදු අයකර ගැනීම සඳහා FriMi ඉතුරුම් ගිණුම හෝ ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ විවෘත කරන ලද වෙනත් බැංකු ගිණුමක් හර කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට හිමිකම ඇත.

ඈ) FriMi ගිණුම අක්‍රිය කිරීමෙන් පසුව, ගනුදෙනුකරුට FriMi ඉතුරුම් ගිණුම සහ FriMi ඩෙබිට් කාඩ්පත භාවිතා කිරීමට හැකි නොවනු ඇත.

ඉ) ගනුදෙනුකරුවෙකුගේ FriMi ගිණුම අවසන් කිරීම මත, අදාළ FriMi ඉතුරුම් ගිණුම සහ FriMi ඩෙබිට් කාඩ්පත වසා අවසන් කරනු ලැබේ.

ඊ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ස්වකීය මතයට අනුව සාධාරණ යැයි සැලකෙන දැනුම් දීමක් ගනුදෙනුකරු වෙත කිරීමෙන් පසු, ගනුදෙනුකරු සමඟ සිය ව්‍යාපාරික සබඳතාව නොකඩවා පවත්වාගෙන යාම පිළිගත නොහෙන බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සලකන යම් සාධාරණ හේතුවක් ඊට තිබේ නම්, කිසියම් නියමිත වේලාවක දී සහ යම් හේතුවක් මත හෝ දැනුම්දීම් කිසිවකින් තොරව, ගනුදෙනුකරුගේ FriMi ගිණුම ඇතුළු යම් FriMi සේවා එකක් හෝ කීපයක් අත්හිටවීමට හෝ අවසන් කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට, එහි තනි සහ පරම අභිමතය පරිදි, අයිතිය ඇත.

උ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ස්වකීය මතයට අනුව සාධාරණ යැයි සැලකෙන දැනුම් දීමක් ගනුදෙනුකරු වෙත කිරීමෙන් පසු, ගනුදෙනුකරු විසින් තම FriMi ඩෙබිට් කාඩ්පත, එය සක්‍රීය කළ දිනයේ සිට මාස හයකට (06 කට) වඩා වැඩි කාලයක් භාවිතා කර නොමැති නම්, එවැනි කාඩ්පතක් ඕනෑම අවස්ථාවක අත්හිටවීමට හෝ අවලංගු කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතියක් ඇත. FriMi ඩෙබිට් කාඩ්පතක් හරහා යම් වංචනික ගෙවීම් ගනුදෙනුවක් සිදු වන බවට හෝ එම කාඩ්පතේ ආරක්ෂාව අවදානමට ලක්ව ඇති බවට හෝ අවදානමට ලක්වීමට ඉඩ ඇති බවට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සැක පහළ කරන්නේ නම්, පෙර දැනුම්දීමකින් තොරව, එකී කාඩ්පත අත්හිටවීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව තමන් සතුව තබා ගනී.

ඌ) ඉහත සඳහන් කර ඇති පරිදි අත්හිටවීම / අවසන් කිරීම පිළිබඳ දැන්වීම, ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් මගින් හෝ ගනුදෙනුකරුගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් හෝ FriMi ඇප් එක හරහා හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන වෙනත් ක්‍රමයක් හරහා හෝ දැනුම් දිය හැකි ය.
ඉහත විස්තර කර ඇති ක්‍රම මගින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් යවන ලද එවැනි දැන්වීම් විවෘත කිරීම සහ සමාලෝචනය කර බැලීම ගනුදෙනුකරුගේ වගකීම වේ.
එතෙකුදු වුවත්, එවැනි අවසන් කිරීමක්, එවන් අවසන් කිරීමකට පෙර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත අත්විය හැකිව තිබූ කිසිදු අයිතිවාසිකමක් කෙරෙහි බල නොපානු ඇති අතර ගනුදෙනුකරු හෝ යම් තෙවන පාශර්වයක් මත වගකීම් බැඳීම් කිසිවකින් තොර විය යුතු ය.

එ) ස්වකීය තනි සහ පරම අභිමතය පරිදි, ගනුදෙනුකරු මත හෝ යම් තෙවන පාශර්වයක් මත වගකීම් බැඳීම් කිසිවකින් තොරව, FriMi ගිණුම ඇතුළුව යම් FriMi සේවා එකක් හෝ කිහිපයක්, යම් සාධාරණ හේතුවක් මත දින දාහතරක (14 ක) පෙර දැනුම්දීමක් මගින් හෝ පූවර් දැනුම් දීමකින් තොරව, ස්වාභිමතය පරිදි, කිසියම් නියමිත වේලාවක දී  සහ කුමන හෝ හේතුවක් මත, ඕනෑම අවස්ථාවක අත්හිටවීමට හෝ අවසන් කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතියක් ඇත.

ඒ) FriMi ගිණුම ඇතුළුව යම් FriMi සේවා එකක් හෝ කීපයක් අවසන් කිරීම හෝ අත්හිටවීම, මෙම නියමයන් සහ කොන්දේසි යටතේ ගැනෙන යම් ගනුදෙනුවකට සහ වෙනත් බැඳීම් කිසිවකට අදාළ ගනුදෙනුකරුගේ වගකීම විෂයයෙහි බලපාන්නේ නැත. එබඳු අවසන් කිරීමකින් අනතුරුව, අදාළ පරිශීලක සම්බන්ධ සාක්ෂි පත්‍ර, අක්‍රිය කිරීම මගින් FriMi සේවාවන් වෙත, සීමා රහිතතාව ඇතුළුව, ප්‍රවේශ වීම තහනම් කිරීමේත්, FriMi සේවාවන් වෙත අනාගත ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීමේත් අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ.

ඔ) ගනුදෙනුකරු මත හෝ යම් තෙවන පාශර්වයක් මත වගකීම් බැඳීම් කිසිවකින් තොරව, ස්වකීය තනි සහ පරම අභිමතය පරිදි, FriMi සේවා සමහරකට හෝ ඒ සියල්ලටම ප්‍රවේශය සීමා කිරීම ඇතුළුව, FriMi සේවා භාවිතය සම්බන්ධයෙන් පොදු පරිච සහ සීමා පැනවීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව තමන් සතුව තබා ගනී.

ඕ) ගනුදෙනුකරු විසින් නියමයන් සහ කොන්දේසි කඩ කරනු ලැබීම හෝ අදාළ නීති රීති සහ රෙගුලාසිවලට (මුදල් විශුද්ධිකරණයට එරෙහි නීති ඇතුළුවන නමුත් ඒවාට සීමා නොවන රෙගුලාසිවලට) පටහැනිව කටයුතු කරනු ලැබීම නිසා හැර, වෙනත් යම් හේතුවක් මත FriMi සේවා අවසන් කළ අවස්ථාවක දී, ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමෙහි ගනුදෙනුකරුගේ බැරට ඇති (යම් ගාස්තු හෝ අයවීම් අඩු කළ) අරමුදල් කිසිවක් හා සම්බන්ධ පියවා දැමීම්, ගනුදෙනුකරු පුද්ගලිකව යනෙන නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ඕනෑම ශාඛාවක ගනුදෙනුකරු විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ගිණුමකට මුදලින් කෙරෙන මාරු කිරීමක් මගින් හෝ ගෙවීම් ඇණවුමක් නිකුත් කර ගනුදෙනුකරු විසින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත සපයනු ලද අවසාන ලිපිනයට තැපැල් කිරීම මගින් (එවැනි අරමුදල් මාරු කිරීමක් සම්බන්ධ යම් පිරිවැයක් ගනුදෙනුකරු විසින් දරනු ලැබීමට යටත්ව) සිදු කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කටයුතු කරනු ඇත.

ක) ගනුදෙනුකරු විසින් නියමයන් සහ කොන්දේසිවලට අයත් විධිවිධාන කඩ කරනු ලැබීම හේතුවෙන් හෝ අදාළ නීති රීති සහ රෙගුලාසිවලට (මුදල් විශුද්ධිකරණයට එරෙහි නීති ඇතුළුවන නමුත් ඒවාට සීමා නොවන රෙගුලාසිවලට) පටහැනිව කටයුතු කරනු ලැබීම හේතුවෙන් FriMi සේවා අවසන් කළ අවස්ථාවක දී, යම් නියාමන අධිකාරියක් විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, ඊට අදාළව පවත්වනු ලබන යම් විමශර්න කටයුතු සහ / හෝ නඩු පැවරුම් කටයුතු නිම වන තුරු සහ / හෝ අදාළ යම් ගෙවීම් කිසිවක් වෙතොත්, ඒවා ගෙවා අවසන් කරන තෙක්, ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමෙහි ඇති අරමුදල් ගෙවීම

අත්හිටවීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට හිමිකම ඇත. අනාගතයේ දී නීති විරෝධී හෝ අනවසර ක්‍රියාකාරකම් සහ / හෝ කායර්යන් සඳහා ගනුදෙනුකරු විසින් FriMi ගිණුම යොදා ගනු ලැබෙතැයි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හඟින්නේ නම්, ස්වකීය පරම අභිමතය පරිදි, පූවර් දැනුම්දීමකින් තොරව, FriMi ගිණුම වෙත ගනුදෙනුකරුගේ ප්‍රවේශය අවලංගු කිරීමට සහ / හෝ නව FriMi ගිණුමක් සාදා ගැනීම සඳහා ගනුදෙනුකරුට ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට පුළුවන.

## 15. හානි පූරණය

ගනුදෙනුකරු විසින්, පහත සඳහන් දැ හේතුවෙන් උද්ගත වන, ඊට සම්බන්ධිත හෝ එමගින් පැන නැගිය හැකි, වන්දි පූරිත පාශර්ව විසින් දරනු ලබන සීමා රහිත සාධාරණ නීතිඥ ගාස්තු සහ වියදම් ඇතුළු සියලු හිමිකම් පෑම්, අලාභ, ඉල්ලීම්, ක්‍රියාමාගර්, ණය හෝ බැරකම්වලින් සහ ඒවාට එදිරිව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ එහි පරිපාලිත ආයතන සහ වෙනත් අනුබද්ධ ආයතන සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්, නිලධාරීන්, හිමිකරුවන්, නියෝජිතයින්, සම සන්නාමකරුවන් හෝ වෙනත් හවුල්කරුවන්, සේවක සේවිකාවන්, තොරතුරු සපයන්නන්, බලපත්‍රදායකයන්, බලපත්‍රලාභීන්, උපදේශකවරුන්, කොන්ත්‍රාත්කරුවන් සහ අදාළ වෙනත් තෙවන පාශර්වයන් (සීමා රහිතව අලෙවිකරුවන්, සේවා සපයන්නන්, වෙනත් මූල්‍ය ආයතන සහ අනෙකුත් ගනුදෙනුකරුවන් ඇතුළුව) (සාමූහික වශයෙන් ගත් කළ, "වන්දි පූරිත පාශර්ව") විෂයයෙහි මුක්තිදානය සලසා දී ඔවුන් ආරක්ෂාකර, නිරුපද්‍රිත කරනු ලැබිය යුතු ය :

(i) ගනුදෙනුකරුගේ FriMi සේවා භාවිතය;
(ii) FriMi සේවා භාවිතා කිරීමේ දී ගනුදෙනුකරුගේ නොසැලකිල්ල හෝ පැහැර හැරීම ;
(iii) ගනුදෙනුකරු විසින් යම් නියමයන් සහ කොන්දේසි කිසිවක් කඩකිරීම හෝ ඒවාට අනුකූල නොවීම ;
(iv) ගනුදෙනුකරුගේ ක්‍රියා හෝ ප්‍රමාද දෝෂ හේතුවෙන් ඇති වන යම් ආරවුල් හෝ නඩු කටයුතු; සහ /හෝ
(v) තෙවන පාශර්වයක් විෂයයෙහි අදාළ වන යම් නීති හෝ අයිතිවාසිකම් කිසිවක් ගනුදෙනුකරු විසින් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කරන ලදැයි ප්‍රවචනය කිරීම.

## 16. වියාචන සහ බැඳියාවේ සීමා

අ) FriMi ඇප් එක හරහා සපයා දෙනු ලැබ ඇති හෝ ඒ සම්බන්ධයෙන් සලසා දෙනු ලැබ ඇති හෝ ඒ හරහා ප්‍රවේශ විය හැකි සියලු අන්තගර්ත දෑ, මෘදුකාංග, කතර්ව්‍යයන්, ද්‍රව්‍ය සහ තොරතුරු ඇතුළු FriMi සේවා "එපරිද්දෙන්ම" ලබා දෙනු ඇත. උපාංග නිෂ්පාදකයින් සම්බන්ධයෙන් සීමා නොවන නමුත් ඔවුන් ද ඇතුළු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ එහි පරිපාලිත ආයතන සහ වෙනත් අනුබද්ධ ආයතන සහ ඔවුන්ගේ නියෝජිතයින්, සම සන්නාමකරුවන් හෝ වෙනත් හවුල්කරුවන් (සාමූහික වශයෙන් ගත් කළ, "නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්ව"), FriMi ඇප් එක හරහා භාවිතා කරනු ලබන හෝ ප්‍රවේශ වන මෘදුකාංගය මගින් ප්‍රවේශ සලසා ගත හැකි සේවාවන් හෝ අන්තගර්තයන්, ද්‍රව්‍ය, තොරතුරු සහ කතර්ව්‍යයන් වෙනුවෙන් හෝ FriMi ඇප් එක හරහා සංවේදී තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට අදාළ යම් ආරක්ෂණයක් කඩකිරීම සම්බන්ධයෙන්, නීතියෙන් ඉඩ දී ඇති පූණර් වපසරිය දක්වා වූ ප්‍රමාණයකට, කිසිදු ආකාරයක නියෝජනය කිරීමක් හෝ වගකීම් සහතිකයක් ලබා නොදේ. සේවාවන් සම්බන්ධයෙන් හෝ උල්ලංඝනය නොකිරීම් සම්බන්ධයෙන් හෝ අලෙවි හැකියාව සම්බන්ධයෙන් හෝ යෝග්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක වගකීම් සහතිකයක් යම් සුවිශේෂ කායර්යක් සඳහා ලබා දීම සෑම නේෂන්ස් ට්‍රස්ට් බැංකු පාශර්වයක්ම සීමා විරහිතව ප්‍රතික්ෂේප කරයි. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්ව, FriMi ඇප් එකෙහි අඩංගු කතර්ව්‍යයන් බාධාවකින් තොරව සිදු වන බවට හෝ දෝෂයකින් තොරව පවතින බවට සහතික නොවේ. ගෙවීම් ගනුදෙනු හෝ සමාන ඇප් අතර කෙරෙන p2p ගෙවීම් හෝ FriMi ඇප් එක හරහා සිදු වන ලැබීම්, සැකසුම් කිරීම්, ප්‍රතිග්‍රහණය කිරීම්, සම්පූණර් කිරීම් හෝ ගනුදෙනු පියවීම් කෙරෙහි බලපෑ හැකි, පද්ධති අසාථර්කවීම්වලට සීමා නොවන නමුත් ඒවා ද ඇතුළු යම් කඩා වැටීම් හෝ වෙනත් බාධා කිරීම් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්ව වගකීම් කිසිවකින් නොබැඳේ.

ආ) යම් ගෙවීම් මෙවලමකට අදාළ යම් තොරතුරක, එකී තොරතුර සීමා විරහිතව ප්‍රවතර්නීය සහ යාවත්කාලීන වේ ද යන තොරතුරු ද ඇතුළුව, නිරවද්‍යතාවය සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්වයන් වගකිව යුතු නොවේ. පෙර සඳහන් වාක්‍යයේ සාමාන්‍යභාවය සීමා නොකර, එකී තොරතුරු නිකුත් කරන්නා විසින් ස්ථාපිත කරන ලද නිශ්චිත කාලසමයක් වන විට දී එම නිකුත් කරන්නා විසින් වාතර්ා කරන ලද බව ද, ගනුදෙනුකරුගේ වත්මන් ගනුදෙනු, පවත්නා ශේෂය හෝ වෙනත් ගිණුමක හෝ වැඩසටහනක විස්තර FriMi ඇප් එක හරහා ගනුදෙනුකරුට ප්‍රදශර්නය කරන අවස්ථාවේ දී හෝ ගනුදෙනුකරු විසින් යම් මිලට ගැනීමක් හෝ මුදාගැනීමක් සිදු කරනු ලබන අවස්ථාවේ දී ඒවා නිවැරදිව පිළිබිඹු නොවීමට ඉඩ ඇති බව ද ගනුදෙනුකරු ප්‍රකාශිතවම පිළිගෙන එකඟ වේ. එබඳු ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරුට අයවීම් සහ වෙනත් ගාස්තු දැරීමට සිදු විය හැකි ය, සහ/හෝ යම් මිලදී ගැනීමක් හෝ මුදාගැනීමක් සිදු කිරීමට ගනුදෙනුකරු දරන උත්සාහය සාථර්ක නොවිය හැකි ය.

ඇ) කිසිදු අවස්ථාවක නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්ව කිසිවක් යම් වක්‍ර, ආනුෂංගීය, විශේෂ, දණ්ඩනීය හෝ ආදශර්වත් හානි හෝ අලාභ සම්බන්ධයෙන් ගනුදෙනුකරුට හෝ තෙවන පාශර්ව කිසිවකට වගකියනු නොලැබේ. එහිලා, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ යම් පාශර්වයක් හෝ FriMi ඇප් එක සම්බන්ධයෙන් ඇති විය හැකි අලාභ හෝ ලාභ සඳහා වන හානි, එහි කීතර්ී නාමය, භාවිතය, දත්ත හෝ වෙනත් අස්පෘශ්‍ය පාඩු යනාදියට සීමා නොවන නමුත්, ඒවා ද, එසේ නැතහොත් FriMi ඇප් එක මාගර්යෙන් මිලට ගෙන ඇති, ලැබ ඇති, විකුණනු ලැබ ඇති හෝ ගෙවා ඇති යම් භාණ්ඩ හෝ සේවා හෝ තොරතුරු, ඊට අදාළ හිමිකම් පෑමේ වගර්ය හෝ ක්‍රියාමාගර්යේ ස්වභාවය කුමක් වුවත්, එවැනි හානියක් හෝ අලාභයක් සිදුවිය හැකි බවට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ පාශර්වයට උපදෙස් දී තිබුණේ වුව ද, ඒවා ද  ඇතුළත් වේ. කිසිම අවස්ථාවක, නියමයන් සහ කොන්දේසි තුළින් උද්ගත වන්නා වූ හෝ ඊට අදාළ වන්නා වූ නේෂන්ස් ට්‍රස්ට් බැංකු පාශර්වයට අයත් මුළු සමුච්චිත බැරකම් ප්‍රමාණය, හිමිකම් පෑමට අදාළ ගෙවීම් ගනුදෙනුවේ වටිනාකම ඉක්මවා නොයා යුතු ය.

ඈ) අනෙක් පාශර්වය, මෙහි සඳහන් කර ඇති බැරකම් සීමා මත විශ්වාසය තබමින් මෙම නියමයන් සහ කොන්දේසිවලට එළඹ ඇති බවත්, එම සීමා, පාශර්ව අතර ගනුදෙනු සම්මුතියෙහි අත්‍යවශ්‍ය පදනමක් බවත් සෑම එක් එක් පාශර්වයක්ම පිළිගනී. ඉහත සඳහන් දෑ කිසිවකට අමතර වශයෙන් සහ ඊට සීමා නොවී, රජයේ ක්‍රියා කලාප හෝ ත්‍රස්තවාදී ක්‍රියා, භූමිකම්පා, ගිනි ගැනීම්, ජල ගැලීම් හෝ වෙනත් දේව  ක්‍රියා, ශ්‍රම තත්වයන්, විදුලිය බිඳවැටීම් සහ අන්තජර්ාල බාධා යනාදියට සීමා නොවන නමුත් ඒවා ද ඇතුළත් එවැනි යම් පාශර්වයක බුද්ධික පාලනයෙන් පරිබාහිර පවත්නා වූ කිසියම් කොන්දේසියක් හේතුවෙන් සිදුවන කිසියම් අසාථර්කවීමක් හෝ ප්‍රමාදයක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ කිසිදු පාශර්වයක් කවර හෝ වගකීමකින්  බැඳෙන්නේ නැත.

## 17. විවිධ කරුණු

අ) FriMi ඉතුරුම් ගිණුමෙහි සටහන් වන සාවද්‍ය පිවිසුම්, වැඩිමනත් පිවිසුමක් ("ප්‍රතිවතර්න පිවිසුමක් ") හරහා ප්‍රතිනමනය කිරීම, නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඊළඟ වාරමය ශේෂ ප්‍රකාශය නිකුත් කරනු ලැබීමට පෙරාතුව හෝ පසුව සිදු කළ හැකි ය. පොළිය (හෝ වෙනත් ප්‍රතිලාභයක්) ගණනය කිරීම සම්බන්ධයෙන් ගත් කළ, එකී සාවද්‍ය පිවිසුම්, ඒවා ඇතුළත් කිරීම් සිදු කළ දින සිට අතීතයට බලපැවැත්වෙන පරිදි, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නැවත ප්‍රවේශනය කරනු ලබනවා ඇත.

ආ) ප්‍රේෂණ :

(i) FriMi ඉතුරුම් ගිණුම හරහා සිදු කෙරෙන විදේශ ව්‍යවහාර මුදල් ප්‍රේෂණ / අණකර ගනුදෙනුකරුගේ පූණර් අවදානම් දැරීම මත යවනු ලැබේ.

(ii) ප්‍රේෂණය කරන ලද යම් අරමුදලක්, ප්‍රේෂණයට අදාළ ව්‍යවහාර මුදල් බවට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් සාමාන්‍යයෙන් පරිවතර්නය කරනු ලබන්නේ, එවැනි අරමුදලක් ඇත්ත වශයෙන්ම නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ලැබුණු දිනයේ දී පවත්නා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි විකුණුම් අනුපාතය මත ය. කෙසේ වෙතත්, ව්‍යවහාර මුදල් පරිවතර්නය කිරීමේ සහ මාරු කර යැවීමේ දිනයන් මුළුමනින්ම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි අභිමතය පරිදි සිදු වන්නේ ය.

(iii) ප්‍රේෂණයක් අවලංගු කරනු ලැබූ කල්හි, ඒ සම්බන්ධ ආපසු ගෙවීමක් සිදු කරනු ලබන්නේ, අදාළ අනු නියෝජිත බැංකුවෙන් ඇත්ත වශයෙන්ම ලැබුණු මුදල මත සහ එකී ආපසු ගෙවීම සිදු කරන දිනයට පවත්නා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි මිලදී ගැනීමේ අනුපාතය මත පදනම්ව පමණි. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් තමා විසින් සහ තම අනු නියෝජිතයන් හෝ ඒජන්තවරුන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට හිමිකම් ඇත. අයකර ගන්නා ලද සියලු අවලංගු කිරීමේ ගාස්තු, අදාළ අයවීම් සහ කොමිස් මුදල් ආපසු ගෙවනු ලැබිය නොහැක.

(iv) ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් හෝ ගෙවීම්වලට උපදෙස් දීම ප්‍රමාද වීම හේතුවෙන් හෝ මාගර්ස්ථව තිබියදී හෝ වෙනත් ආකාරයකින් භාණ්ඩ නැතිවීම හෝ විකෘති කිරීම, දෝෂ අත්හැරීම හෝ බාධා වීම හේතුවෙන් හෝ කිසියම් භාණ්ඩයක්, ලිපියක් සම්ප්‍රේෂණය කිරීම හෝ භාරදීම ප්‍රමාද වීම හේතුවෙන් හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයත් අනු නියෝජිතයින්ගේ හෝ ඒජන්තවරුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වගකියනු නොලැබේ.

(v) විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවලට විදේශ විනිමය අවදානම් ඇතුළත් විය හැකි බවට පූණර් වැටහීමකින් යුතුව ගනුදෙනුකරු සෑම විදේශ මුදල් ගනුදෙනුවක් සඳහාම ඇතුල් වනු ඇති අතර, එකී අවදානම් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වගකීම් දරනු නොලැබේ.

ඇ) උපලේඛනගත ගෙවීම් :

(i) ගනුදෙනුකරුට FriMi ඇප් එක හරහා එක වරක් කෙරෙන ගෙවීම් හෝ නැවත නැවත සිදු වන ගෙවීම් උපලේඛනගත කර ගත හැක්කේ, යම් නියමිත අවස්ථාවක දී ලබා ගත හැකි ("උපලේඛනගත ගෙවීම්") එබඳු පහසුකමක් ඇති ගෙවීම් මෙවලමක් හර කිරීම මගිනි.

(ii) උපලේඛනගත ගෙවීම් සහ චෙක්පත් ගෙවීම් ඇතුළු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ පවත්නා වෙනත් ගෙවීම් විධිවිධාන ආශ්‍රිත ගෙවීම්, අරමුදල් ලබා ගැනීමේ හැකියාවට සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි අදාළ සේවා ප්‍රමිතීන්ට යටත්ව, "පළමුව පැමිණ, පළමුව සේවය ලබන පදනමක්" මත හසුරුවනු ලැබේ.

(iii) උපලේඛනගත ගෙවීමක් ක්‍රියාත්මක කිරීම සඳහා ගනුදෙනුකරු අදාළ ගෙවීම් මෙවලමෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වා ගෙන යා යුතු ය. උපලේඛනගත ගෙවීමක් ක්‍රියාත්මක කරනු පිණිස ප්‍රමාණවත් අරමුදල් නොමැති විටෙක, නියමිත දිනට එය ක්‍රියාත්මක කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව භාර නොගනී. එවැනි ගෙවීමක් ක්‍රියාත්මක කරනු ලබන්නේ, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටියට අනුකූලව එවැනි ගෙවීමක් ක්‍රියාත්මක කිරීම සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කටයුතු කරන කාල සීමාව තුළ අදාළ අරමුදල් පසු කාලීනව ලබා දී තිබේ නම් පමණි.

(iv) උපලේඛනගත ගෙවීම් ක්‍රියාත්මක වනු පිණිස ඊට අදාළව යම් බලපැවැත්වෙන දිනයක් තෝරා ගැනීමේ දී, ඉහත ඇ) හි (iii) වන වගන්තියට යටත්ව, එවැනි උපලේඛනගත ගෙවීම්, ගනුදෙනුකරුගේ මරණය / බංකොලොත්භාවය / මානසික අබලතාව පිළිබඳ දැනුම්දීමක් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ලැබුනහොත් හෝ ගනුදෙනුකරු විසින් උපලේඛනගත ගෙවීම් අවලංගු කළහොත් හෝ අදාළ ගෙවීම් මෙවලම නිෂ්ක්‍රීය වුවහොත් මිස, අදාළ නියමිත දිනයේ දී බලාත්මකවී ගනුදෙනුකරු විසින් තෝරා ගන්නා ලද කාල සීමාව තුළ ක්‍රියාත්මකව පවතින බව ගනුදෙනුකරු විසින් අවබෝධ කර ගනු ලැබිය යුතු ය.

(v) ගනුදෙනුකරු විසින් උපලේඛනගත ගෙවීම් සඳහා FriMi ඇප් එක භාවිතා කිරීම, ක්‍රියාත්මක නොකිරීම, ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් සහ / හෝ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරුගේ උපදෙස් අනුව උපලේඛනගත ගෙවීම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ගනුදෙනුකරුට සිදුවන යම් ආනුෂංගීය අලාභයක් හෝ හානියක් ඇතුළු අලාභ සහ / හෝ හානි සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වගකියනු නොලැබේ. උපලේඛනගත ගෙවීම් සම්බන්ධයෙන් නිවැරදි උපදෙස් සැපයීම, එවැනි උපලේඛනගත ගෙවීම් නිරීක්ෂණය කිරීම සහ ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යාම සඳහා වන පූර්ණ වගකීම ගනුදෙනුකරු දරයි. ඒ සම්බන්ධයෙන් ගනුදෙනුකරුගේ කිසිදු දෝෂයක් / අත්හැරීමක් විෂයයෙහි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව කිසිදු ආකාරයකින් වගකියනු නොලැබේ.

(vi) 9 වන වගන්තියෙහි වඩාත් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි උපලේඛනගත ගෙවීම් සඳහා ගාස්තු සහ අයවීම් අය කර ගැනීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

(vii) FriMi ඇප් එකට අදාළ ගෙවීම් මෙවලම් ප්‍රකාශයෙහි සහ ගනුදෙනු ඉතිහාසයෙහි ඇති තොරතුරු ලබා ගත හැකි බැවින්, උපලේඛනගත ගෙවීම් සම්පාදනය කර ඇති බව දැක්වෙන වෙනම දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

(viii) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් උපලේඛනගත ගෙවීම් සිදු කරනු ලබන්නේ, එහි සම්මත සේවා මට්ටම්වලට අනුකූලව ය.

ඈ) මෙහි විස්තර කර ඇති කිසියම් සේවාවක් භාවිතයට ගනිමින් සකසන ලද යම් ගනුදෙනුවකින් පැන නගින ගනුදෙනුකරු වෙත ලැබීමට නියමිත අරමුදල් කිසිවක් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සන්තකයේ පවතින්නේ නම් ද, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට ගනුදෙනුකරු සම්බන්ධ කර ගැනීමට නොහැකි නම් සහ අදාළ නීතිය මගින් නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා ගනුදෙනුකරු තම සේවාව භාවිතා කිරීම සම්බන්ධයෙන් වාතර්‍ා කිසිවක් නොමැති නම් ද මෙම අරමුදල්. හිමිකම් නොපෑ හෝ අතහැර දැමූ දේපළ ලෙස වාතර්‍ා කර, අවසාන වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව වැනි නියාමන ආයතන වෙත ඒවා භාර දීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සිදු විය හැකි ය. අදාළ නීති මගින් අවසර දී ඇති පරිදි, එවැනි හිමිකම් නොපෑ අරමුදල්වලින් නිද්‍රාණ ගාස්තුවක් හෝ වෙනත් පරිපාලන ගාස්තු අවකරණය කර ගැනීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

ඉ) FriMi ඉතුරුම් ගිණුම හරහා මාස විසිහතරක (24ක) කාල පරිච්ඡේදයක් තිස්සේ ගනුදෙනුකරු විසින් මුල පුරන ලද ක්‍රියාකාරකමක් නොමැති විට හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා නිෂ්ක්‍රීය වගීර්කරණය සුදුසු යැයි නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සලකනු ලබන විට, FriMi ඉතුරුම් ගිණුම නිෂ්ක්‍රීය යැයි සලකනු ලැබේ. නිෂ්ක්‍රීය ගිණුමක් නැවත සක්‍රිය කිරීමට පෙර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරු සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡාවකින් පසුව අදාළ නිෂ්ක්‍රීය තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් ගනුදෙනුකරු වෙතින් ලබා ගන්නා අතර, ගනුදෙනුකරු විසින් ඊට අදාළ පැහැදිලි කිරීම් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ලබා දිය යුතු ය.

යම් නිෂ්ක්‍රීය FriMi ඉතුරුම් ගිණුමක් නැවත සක්‍රිය කිරීමට පෙර, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන ලිපි ලේඛන, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට තම අභිමතය පරිදි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට සිදු විය හැක.

FriMi ඉතුරුම් ගිණුම නිෂ්ක්‍රීය යැයි වර්ගීකරණය කර ඇති විටෙක දී, එම නිෂ්ක්‍රීය තත්ත්වය ඉවත් කළ යුතු බවට සෑහීමට පත්වන තෙක්, එවැනි ගිණුමක් නමින් ලියන ලද චෙක්පත් ගෙවීම් ඇතුළුව, එම ගිණුමට අදාළ ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතිය ඇත.

ඊ) අදාළ නීතිවලට (විශේෂයෙන්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 544 වන වගන්තියට) යටත්ව සහ ඊට අනුකූලව, ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමේ බැරට ඇති සියලුම මුදල් සම්බන්ධයෙන් තම මරණයෙන් පසුව (අදාළ සියලු හිඟ ගාස්තු සහ ගාස්තු අයවීම් ගෙවා දැමීම මත) හිමිකම් කියා පෑමට, ඒවා ඉල්ලා සිටීමට සහ පවරා ගැනීමට හෝ ගෙවන ලෙසට ප්‍රතිලාභියෙකු නම් කිරීමට ගනුදෙනුකරුට හැකි ය.

උ) FriMi ඇප් එක භාවිතය හේතුවෙන් පැන නගින අදාළ බදු පිළිබඳව වාතර්‍ා කිරීම සහ ඒවා ගෙවීම ගනුදෙනුකරුගේ වගකීම වේ. FriMi ඇප් එක භාවිතය සම්බන්ධයෙන් අදාළ වන යම් සහ සියලු බදු නීතිවලට ගනුදෙනුකරු අනුකූලතාව දක්වා කටයුතු කළ යුතු ය.

ඌ) ගනුදෙනුකරු වෙත කෙරෙන දැනුම් දීමක් මගින්, ඕනෑම වේලාවක මෙම නියමයන් සහ කොන්දේසිවල යම් කොටසක් ස්වකීය තනි හා පරම අභිමතය පරිදි සහ ගනුදෙනුකරු විෂයයෙහි කිසිදු වගකීමකින් තොරව, වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ සංශෝධනය කිරීමට නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට අයිතිය ඇත.

එ) ගනුදෙනුකරු වෙත කෙරෙන පූවර් දැනුම් දීමක් ඇතිව හෝ නැතිව ඕනෑම වේලාවක ස්වකීය තනි හා පරම අභිමතය පරිදි සහ ගනුදෙනුකරු විෂයයෙහි කිසිදු වගකීමකින් තොරව, FriMi සේවාවන් වෙනස් කිරීමේ හෝ අමුතු කිරීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු ය.

ඒ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ස්වකීය තනි අභිමතය පරිදි තමන්ට සුදුසු යැයි හඟින යම් කායර්යන් සඳහා ගනුදෙනුකරුට අයත් ඕනෑම ගනුදෙනුවක් සහ / හෝ ඕනෑම ගෙවීම් මෙවලමක් සම්බන්ධයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් කරනු ලබන යම් වාතර්‍ා තබා ගැනීම්වලට සහ / හෝ ගනුදෙනුකරු පිළිබඳව කෙරෙන යම් තොරතුරු හෙළිදරව් කිරීම්වලට ගනුදෙනුකරු විසින් මෙයින් අවසර ලබා දී තම එකඟත්වය පළ කරයි. යම් ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කායර්‍ාංශයෙහි පවත්නා ගනුදෙනුකරුවකුගේ ණය තොරතුරු ("CRIB") වෙත ප්‍රවේශ වීමට ද, ගනුදෙනුකරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත තම කැමැත්ත පළ කරයි.

ඔ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාතර්මේන්තුවට අයත් ජාතික හැඳුනුම්පත් පිළිබඳ දත්ත සත්‍යාපනය කර ගැනීමේ මාගර්ගත අන්තජර්‍ාල සේවය හරහා ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පතට අදාළ තොරතුරුවල සත්‍යතාව ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු මෙයින් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව වෙත තම එකඟත්වය පළ කර ඊට බලය පවරයි.

ඕ) ගනුදෙනුකරුගේ නම, ජංගම දුරකථන අංකය සහ පසුම්බි හැඳුනුම්පත (වොලට් හැඳුනුම්පත) වැනි ගනුදෙනුකරුගේ විස්තර, දෘෂ්‍ය වීඩියෝ මාධ්‍යයෙන් "ඔබේ ගනුදෙනුකරු පිළිබඳව දැන ගන්න" (KYC) යන නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ සත්‍යාපන පද්ධතියෙහි ඇතුළත් කෙරෙනු ඇති අතර, එම පද්ධතිය සපයන නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ සැපයුම්කාර ආයතනයේ (vendor) වීඩියෝ KYC සත්‍යාපන පද්ධතිය තුළ ගනුදෙනුකරු පිළිබඳ එකී විස්තර සටහන්ව ඇති බව ගනුදෙනුකරු පිළිගනී. නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට මෙන්ම ගිණුම් විවෘත කිරීමේ කායර්ය සඳහා වන නියාමන අවශ්‍යතාවලට අනුකූලව ගනුදෙනුකරු පිළිබඳ තොරතුරු සත්‍යාපනය කිරීම අත්‍යවශ්‍ය අංගයක් වන බැවින් එලෙස එම තොරතුරු වාතර්‍ා කර තබා ගැනීම සඳහා ගනුදෙනුකරු මෙයින් තම කැමැත්ත පළ කරයි.

ක) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් FriMi ඇප් එක හරහා වරින් වර විවිධ ඉතිරි කිරීමේ නිපැයුම් සහ සේවා හඳුන්වා දෙනු ලැබිය හැකි අතර, ඒවා මෙම නියමයන් සහ කොන්දේසි වලට අමතරව වෙනම නියමයන් සහ කොන්දේසි වලට යටත් විය හැකි ය.

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුට අයත් කිසියම් ගෙවීම් මෙවලමක් හර කිරීම මගින් ස්ථාවර තැන්පතු ඇරඹීම සඳහා කලින් කල FriMi ඇප් එක හරහා උපදෙස් ලබා දීමට ගනුදෙනුකරුට හැකි ය. FriMi ඇප් එක හරහා විවෘත කරනු ලබන ස්ථාවර තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතය, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි වෙනත්

ගනුදෙනු මාගර් හරහා විවෘත කරනු ලබන ස්ථාවර තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතවලට වඩා වෙනස් විය හැකි බව ගනුදෙනුකරු පිළිගනී.

ග) නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව, ගනුදෙනුකරු විසින් FriMi ගිණුම හෝ මෙම නියමයන් සහ කොන්දේසි යටතේ ගැනෙන කිසියම් අයිතිවාසිකමක් හෝ බැඳීමක්, නීතිය ක්‍රියාත්මක කිරීම මගින් හෝ වෙනත් ආකාරයකින්, පවරා දීම නොකළ යුතු අතර එවැනි පැවරුම් තැත් කිරීමක් බල රහිත වේ. කිසිවකුට දැනුම්දීමකින් හෝ කිසිවකුගේ එකඟත්වයකින් තොරව, කිසියම් තෙවන පාර්ශවයකට මෙහි දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සහ අයිතිවාසිකම් සහ බැඳීම් නිදහස් ලෙස පවරා දීමේ අයිතිය නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සතු වේ. ඉහත සඳහන් කරුණු වලට යටත්ව, මෙම නියමයන් සහ කොන්දේසි, මීට සම්බන්ධ පාර්ශවයන්ගේ, ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින්ගේ සහ අවසර ලත් පැවරුම්ලාභීන්ගේ ප්‍රයෝජනය පිණිස අනුගම්යව බැඳී ක්‍රියාත්මක වනු ඇත.

ච) ගනුදෙනුකරු මෙම නියමයන් සහ කොන්දේසි පිළිගෙන තිබේ ද යන්න නිගමනය කිරීමෙහිලා සහය වනු පිණිස "කුකීස්" භාවිතා කිරීමට ගනුදෙනුකරු නේෂන්ස් ට්‍රස්ට් බැංකුව හට අවසර දෙයි. “කුකීස්” (“cookies”) යනු, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි වෙබ් සේවා පරිගණකය (web server) මගින් ගනුදෙනුකරුගේ ජංගම උපාංගය මත පිහිටුවා තබන කුඩා ගොනු වගර්යකි.

ජ) FriMi ඇප් එක හරහා සපයනු ලබන වෙනත් විවිධ නිපැයුම් සහ සේවාවන්ට අදාළ නියමයන් සහ කොන්දේසි ගනුදෙනුකරු මත අනුගම්යව බැඳී පවතින්නේ, යම් අවස්ථාවක එබඳු නිපැයුම් / සේවා ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් ඊට අදාළ නියමයන් සහ කොන්දේසි පිළිගෙන ඒ සඳහා ලියාපදිංචි වන්නේ නම් සහ ඒ සඳහා ලියාපදිංචි වන විට පමණි.

ට) මෙම නියමයන් සහ කොන්දේසි වලට අමතර වශයෙන්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි ආයතනික වෙබ් අඩවියේ https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf වෙබ් ලිපිනය වෙත පිවිසීමෙන් ගනුදෙනුකරුට නිරීක්ෂණය කළ හැකි නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි වල අන්තගර්ත කර ඇති නියමයන් සහ කොන්දේසි වලට ද ගනුදෙනුකරු බැඳී සිටී. මෙම නියමයන් සහ කොන්දේසි මගින් විශේෂාකාරව ආවරණය නොවන්නා වූ කවර හෝ කරුණක් සඳහා ගනුදෙනුකරු විසින් සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි පරිශීලනය කළ යුතු ය.

ඩ) නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගනුදෙනුකරු වෙත සපයා දෙනු ලබන FriMi සේවාවන් සහ මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය වේ.